39 වෙළුම - 3 කලාපය 2022
ISSN 1391-0299

# විදුරාව

ජාතික විද්‍යා පදනමේ විද්‍යා සඟරාව



# සම්ප්‍රදායික කෘෂි දැනුමෙහි විද්‍යාත්මක පසුබිම

NATIONAL SCIENCE FOUNDATION

# විදුරාව

39 වෙළුම - 3 කලාපය
2022 ජූලි - සැප්තැම්බර්

**සභාපති**
මහාචාර්ය රංජිත් සේනාරත්න

**අධ්‍යක්ෂ ජනරාල්**
ආචාර්ය සේපාලිකා සුදසිංහ

**ජාතික විද්‍යා පදනමේ විදුරාව අනු කමිටුව**
තුසිත මලලසේකර
අසෝක ද සිල්වා
ආචාර්ය ගෞරි මූර්ති
ආචාර්ය එන්. කාර්තිකේයන්

**සංස්කාරක**
තුසිත මලලසේකර

**සංස්කරණ උපදේශකත්වය**
ආචාර්ය පී. ආර්. එම්. පී. දිල්රුක්ෂි

**විදුරාව සම්බන්ධීකාරක**
අපේක්ෂා හේරත්

**අකුරු සැකසුම හා පිටු නිර්මාණය**
ලක්ෂිකා පියුමි නිශ්ශංක

**පිටකවරය**
ලක්ෂිකා පියුමි නිශ්ශංක

**ප්‍රකාශනය සහ මුද්‍රණය**
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

**පිළිබිඹු මූලාශ්‍රයඃ ලේඛකයන්/අන්තර්ජාලය**
දුරකථනයඃ 2696771
ෆැක්ස්ඃ 2694754
විද්‍යුත් ලිපිනයඃ vidurava@nsf.gov.lk

විදුරාව විද්‍යා සඟරාව ජාතික විද්‍යා පදනමේ වෙබ් අඩවිය වන www.nsf.gov.lk හි අන්තර්ගත කොට ඇත.

**පටුන**

2 කතුවැකිය

3 සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ විද්‍යාත්මක පසුබිම
ආචාර්ය පී. බී. ධර්මසේන

14 සම්ප්‍රදායික කාලගුණ පුරෝකථන පසුබිමේ පවත්නා විද්‍යාව
ඩිලානි හිරිමුතුගොඩගේ

19 දේශීය දැනුම සහ පළිබෝධ මර්ධනය
මතුගම සෙනෙවිරුවන්

23 පාරම්පරිකව සතුන් රැකබලා ගැනීම සහ විශේෂ ප්‍රතිකාර
විජේරත්න දුටුවැව

28 සාම්ප්‍රදායික කෘෂි පසුඅස්වනු පිළිවෙත් තුළින් ආහාර සුරක්ෂිතතාව කරා..
මහාචාර්ය සංජීවනි ගිනිගද්දර

32 ලැබූ දැනුම විමසමු




© ජාතික විද්‍යා පදනම-ශ්‍රී ලංකාව
ISSN 1391-0299

NATIONAL SCIENCE FOUNDATION

මෙම ප්‍රකාශනයෙහි අඩංගු ලිපිවල අන්තර්ගතය එම ලිපි සැකසූ ලේඛකයන්ගේ අදහස් වන අතර ජාතික විද්‍යා පදනම ඒ හා සම්බන්ධව වග කියනු නොලැබේ.

# කතුවැකිය

## සම්ප්‍රදායික දැනුම කුමකටද?

ලොව කවර තැනක, කෙලෙසක ජීවත්වූවත් මිනිසුන්වන අපව, අපගේ අදාළ දේශයට බැඳතබන දැලක් පවතියි. සංස්කෘතිය ලෙස පුළුල්ව හඳුන්වන්නේ මේ දැලයි. වර්තමානයේ තරම් සමෝධනික නොවූ පෙර යුගයන්හීද මිනිස් ජීවිත හසුරුවනු ලැබුනේ සංස්කෘතිය තුළින් ජනිතවන දැනුම් සම්භාරයන් තුළිනි. නිරීක්ෂණ, ගවේශණ, අත්දැකීම්, අත්හදාබැලීම් ආදියෙන් හැඩගැස්සා ගත් මෙම දැනුම "දේශීය දැනුම" ලෙස නම් ලැබුහ. එය පරම්පරාවෙන් පරම්පරාවට පහළට රූටා ගලන විට "පාරම්පරික දැනුම" ලෙස හැඳින්වීමට පියවර ගැනින. 'දේශීය' දැනුම හා 'පාරම්පරික' දැනුම යම් සීමාවන්ට යටත්වන නිසා මෙයට සීමා මායිම්වලින් තොර වූ නාම ගැන්වීමක් අවශ්‍ය විය. එතැන් සිට "සම්ප්‍රදායික දැනුම" යන වාසගම මෙයට ආරූඪ කරන්නට ඇත.

සම්ප්‍රදායික දැනුම ලොව පුරා පුළුල්ව පැතිරුනද සෑම විෂයකටම එය එකම දැනුම නොවිය. අප්‍රිකානු ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආසියානු ජනතාවගේ සම්ප්‍රදායික දැනුමට වඩා වෙනස් විය. එය පරිසරමය උරුමයකි. සමහර තැනෙක මෙම දැනුම තුළ එකම බීජාංශු පවතින බව පෙනීයයි. කෙසේවුවද වසර සිය දහස් ගණනාවක් තිස්සේ ජනතාව සිය ජිවිත එළිපෙහෙළි කරගත්තේ තමන් වටා පැවති මෙම දේශිය, පරම්පරික හෝ සම්ප්‍රදායික දැනුම ලෙස නම් ලද දැනුම් පරාසය ප්‍රයොජනයට ගනිමිනි.

එහෙත් නවීන විද්‍යාව උපත ලැබීමත් සමගම සම්ප්‍රදායික දැනුම යම් පසුබැස්මකට ලක්වූ බව නොරහසකි. විද්‍යාත්මක දැනුම පුළුල් වෙමින් පහසු සහ නවීනම ක්‍රමෝපායන්හි, උපක්‍රම එළිපෙහෙලි වන විට සම්ප්‍රදායික දැනුම නොසලකා හැරීමට පමණක් නොව එය පහත්කොට සැළකීමටද මිනිසා පෙළඹෙනු දැකිය හැකිවිය. එලෙස වුවද විද්‍යාඥයින් යැයි වර්තමානයේ නම් ලබන විද්වතුන් සිය විජයග්‍රහණයන් සිදුකලේ අතීත සම්ප්‍රදායික දැනුම සුරකමිනි. සත්ව ඇටකටු, ශාක කොටස්, ඛනිජ ද්‍රව්‍ය යොදා සිය ගොවිබිම් සරුකරන ගොවියා දෙස අද හොරඇසින් බලන විද්‍යාඥයින් ඒවා තුල පැවති නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම්, කැල්සියම් ආදී මූලිකාංග පදමට ගෙන කෘතිම පොහොර නිපදවීම සිදුකරයි. සින්කෝනා පොත්ත තම්බා බිවූ කළ මැලේරියාව සුව වන බව දැනගත්විට සින්කෝනා පොත්තේ ඇති කුවිනින් සංඝටකය පෙරාගෙන කුවිනින් පෙති නිපදවූයේ මැලේරියාවට ප්‍රත්‍යක්ෂ වන නූතන සොයා ගැනීමක් ලෙස පාරම්බාමිනි. බුදුන් වහන්සේගේ සිය අසීමිත ඥානයෙන් ගවේෂණය කර දේශනා කළ සතිපට්ඨානය අද ''මයින්ඩ්ෆුල්නස්'' ලෙසට විකාශණය වී ඇත්තේය.

වර්තමානයේදී ලෝකයේ සිදුකර ඇති අධ්‍යයන ගණනාවක් මගින් පෙන්වා දෙන්නේද ඕනෑම සංවර්ධන කාර්යයක අපේක්ෂිත ප්‍රතිඵල හිමිකර ගැනීමට ඇති සුදුසුම ක්‍රියාමාර්ගය වනුයේ ග්‍රාමීය ජනතාව තුල පවත්නා සම්ප්‍රදායික දැනුම පිළිබඳව විමසා බලා එයට අනුකූල වනසේ සංවර්ධන ව්‍යාපෘති අනුගත කිරීම බවය. ජනතාව තුළ පවත්නා සම්ප්‍රදායික හා දේශිය දැනුම නොසලකා සිදුකරන බර කාර්යයක් තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම අසීරු බව ලෝකයේ බොහෝ රටවල සිදුකළ අධ්‍යයන හෙළිකර ඇත. සම්ප්‍රදායික දැනුම භාවිතා කිරීම යනු කිසිවිටකත් සීඝ්‍රයෙන් හා සුපරීක්ෂාවෙන් යුතුව යම් කාර්යයක් සිදු නොකර සිටීම නොව ජනතාව තුල පවත්නා දැනුමද උපයෝගි කරගෙන වර්තමාන විද්‍යාත්මක දැනුම සුදුසු ලෙස පරිභෝජනය කිරීම ලෙස වටහා ගත යුතුය. උදාහරණයක් ලෙස පුරන් කුඹුරු යායක ඇළ මාර්ග පිළියෙල කිරීමට මහා යන්ත්‍රසූත්‍ර යොදාගෙන සිදුකළ ප්‍රයත්නයකින් පසුව ලියදිවලට දෙපාවෙන් ජලය ලබා ගැනීම හෝ ලියදිවල තිබු ජලය දෙපාවට වැස්සවීම හෝ කළ නොහැකි තත්වයට ඇල ගැඹුරුවීම දැක්විය හැකිය. යායේ කුඹුරු හිමියන්ගෙන් විමසුයේ නම් ඇල හෑරිය යුතු ගැඹුර දැනගැනීමට තිබුණි. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ අපට යළිත් සම්ප්‍රදායික දැනුම මෙන්ම දේශීය දැනුමද සිහිපත්වූයේ රට මුහුණ දී ඇති අතිදරුණු ආර්ථික අවපාතය නිසාය. සුපිරි වෙළඳසැල් වලට ගොස් මල්ල පුරවා ගෙන ආ බොහෝ දෙනෙකු අද කොම්පෝස්ට් (කාබනික) පොහොර යොදාගෙන සිය ගෙවත්තේ පැලයක් දෙකක් වගා කිරීමට පියවර ගැනීමට තරම් මෙම ආර්ථික අර්බුදය ආහාර සුරක්ෂිතතාවට පහර එල්ල කර ඇත්තේය.

මේ හේතු නිසාම "විදුරාව" මෙවර කලාපය තුළින් අපගේ කෘෂිකර්මයට සම්ප්‍රදායික දැනුම ලබා ගැනීමේ ඇති වැදගත්කම හුවා දැක්වීමට සුළු ප්‍රයන්තයක යෙදී ඇත. එය සම්ප්‍රදායික දැනුම නම් මහා සාගරයෙන් දිය දෝතක් ගැනීම තරම් වූ ප්‍රයත්නයක් බව සැබෑය.එහෙත් එය කළයුත්තක් බව ඔබද පිළිගනු ඇත.

**තුසිත මලලසේකර**

# සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ විද්‍යාත්මක පසුබිම

ආචාර්ය පී. බී. ධර්මසේන



"දැනුම් පද්ධති බොහෝය. මේ අතරින් නවීන විද්‍යාව වඩාත්ම බලගතු සහ විශ්වීය වුවත් එය ඉන් එකක් පමණි. ග්‍රාමීය ජනයාගේ දැනුම ඊට වෙනස්ව පවතින්නාසේම, එය ප්‍රදේශය, කණ්ඩායම් හෝ පුද්ගල යන අංශයෙන්ම වෙනස් වන අතර එය අත්හදා බැලීම් සහ ඉගෙනීමේ ආකාරවලින්ද වෙනස් වේ: වෙනස් පුද්ගලයන් වෙනස් දේ වෙනස් ලෙස දකින අතර තමන් අලුත් දේ ඉගෙන ගන්නේද වෙනස් ආකාරයටය." - රොබට් චේම්බර්ස්, 1994

ඉතිහාසය පුරාවට විවිධ ප්‍රජාවන් ස්වභාවධර්මය හා දේශීය පරිසර පද්ධතිය සමඟ සංකීර්ණ ලෙස බැඳී ඇති සංස්කෘතියක් සහ ජීවන රටාවක් වර්ධනය කර ගෙන ඇත. ඔවුන් ලබාගත් දැනුම, ඔවුන්ගේ ඇදහිලි පද්ධති, මිථ්‍යාවන් සමාජයේ ජනප්‍රවාදවලට තදින් කාවැදී ඇති අතර එය දේශීයත්වය ප්‍රදර්ශනය කරයි. එය සම්පත් භාවිතය සහ පරිසර සංරක්ෂණය පිළිබඳ තීරණ සඳහා උපකාරී වේ. එය ස්වභාවික විපත්වල සිදුවීම් සහ එහි සෘණාත්මක බලපෑම් වළක්වා ගැනීමට උපකාරී වේ. එය කෘෂිකාර්මික පිළිවෙත් සහ ආහාර සංරක්ෂණය, සෞඛ්‍ය රැකවරණය සහ වෙනත් ක්‍රියාකාරකම් රාශියක් පිළිබඳ මාර්ගෝපදේශ සපයයි.එය බොහෝ දුරට ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන පරිසර කළමනාකරණ පද්ධතියකි. මෙම සිරිත් විරිත් සහ සම්මතයන් බලාත්මක කිරීම බොහෝ විට සමාජ අනුකූලතාවයෙන් සහ ක්තෙනය කරන ලද අභියෝග මගින් සහතික කෙරේ. වෙනත් රටවල මෙන්ම දේශගුණයේ ස්වභාවය, භූ රූප විද්‍යාව සහ ජල විද්‍යාව මත පදනම්ව ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයද පරිණාමය වී ඇත. පසුගිය දශක 2-3 තුළ, සාම්ප්‍රදායික දැනුම සහ තිරසාර සංවර්ධනය අතර ශක්තිමත් සම්බන්ධතාවයක් පෙන්නුම් කරන විශාල සාක්ෂි ප්‍රමාණයක් හෙළිවී ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල මහත් වූ ජනගහනය ඔවුන් සතු කාලයේ පරීක්ෂාවට ලක්වූ භාවිතා මගින් දිවි රැකගත් අතර, පරිසර ආරක්ෂණය හා ආපදා කළමනාකරණය පිළිබඳ පාරම්පරික දැනුම හේතුවෙන් එම රටවල සිදුවිය හැකි ස්වභාවික විපත්වල බලපෑම්ද බොහෝ දුරට අවම වී ඇත. අන්‍යෝන්‍යය වශයෙන් වාසිදායක ප්‍රතිඵල සොයා ගැනීම සඳහා පාරම්පරික දැනුම සමඟ එක්ව විද්‍යාව හා තාක්ෂණය භාවිත කිරීමට උත්සාහ කිරීමේ ප්‍රවණතාව දැන් වැඩි වෙමින් පවතී.

සංවර්ධන ව්‍යාපෘතිවල අනුගමනය කළ හැකි හොඳම ප්‍රයත්න සාර්ථක වන්නේ ග්‍රාමීය ජනතාවගේ සම්ප්‍රදායික අයිතීන් පිළිබඳ අවබෝධයක් සමඟ සහයෝගීතාවයෙන් සහ අන්‍යෝන්‍ය අවබෝධයෙන් සැලසුම් ක්‍රියාත්මක කරන්නේ නම් පමණි.

මෙරට ස්ථාපිත වූ පැරණිතම කෘෂිකාර්මික ජනාවාස ස්ථාපිත වී ඇත්තේ යාන්ඔය, මල්වතුඔය, කලාඔය සහ දැදුරුඔය වැනි සෘතුමය ගංගා නිම්නවල ය. ආරම්භයේදී වර්ෂා පෝෂිත තත්ත්වයන් යටතේ වගා කළ බෝග වනුයේ වී සහ මෙනේරි ය. ශිෂ්ටාචාරය මගින් වාරි තාක්ෂණය නව්‍යකරණය වූ අතර වී වගාව සඳහා ජලය සැපයීම සඳහා විශේෂයෙන් වියළි කලාපයේ විවිධ ප්‍රමාණයෙන් සහ හැඩයෙන් යුත් කුඩා වාරි වැව් දහස් ගණනක් ඉදිවිය. මෙම ජල ශිෂ්ටාචාර යුගය ආරම්භයේදී එක් කන්නයක පමණක් වී වගා කළ අතර වියළි කාලයේදී එම ඉඩම් පුරන් විය. වැසිදිය පෝෂිත තත්වයන් යටතේ අතිරේක ආහාර බෝග සමඟ හේන් වගාව සිදු කරන ලදී. දහනවවන සියවස දක්වාම යැපුම් කෘෂිකර්මාන්තය රටේ ප්‍රධානතම ආහාර නිෂ්පාදන මාර්ගය විය.

ශ්‍රී ලංකා ඉතිහාසයේ වසර පන්දහසක් තරම් ඈතට විහිදෙන පැරණිතම වගාව ලෙස හේන් ගොවිතැන සැලකේ. හේන් වගාව සාම්ප්‍රදායික චාරිත්‍රයක් වූ අතර පැරණි ශ්‍රී ලාංකිකයන් මෙම

ක්‍රියාවලියේදී පරිසරයට හානියක් නොවන බව සහතික කළහ. හේන් වගා කිරීම සඳහා භාවිත කරන ශිල්පීය ක්‍රම දේශගුණය, පසෙහි ස්වභාවය මෙන්ම ප්‍රදේශයේ අනෙකුත් පාරිසරික හා ස්ථානීය විද්‍යාත්මක සාධක ඇතුළු විචල්‍ය පරාසයක් මත රඳා පැවතුනි. ශ්‍රී ලංකාවේ හේන් වගාව ප්‍රධාන වශයෙන් සිදු කරනු ලැබුවේ පිරිමින් විසිනි. කෙසේ වෙතත්, කුරුල්ලන් සහ සතුන් එලවීම මගින් බෝග ආරක්ෂා කිරීම වැනි විවිධ ආකාරවලින් කාන්තාවන් සහ ළමයින් ද ඔවුන්ගේ දායකත්වය හේන් ගොවිතැනට ලබා දුන්හ.

හේන් වගාකිරීම සාමූහිකව සිදු කරන ලදී. එහිදී සෑම ගමකටම එක් හේන් යායක් තිබූ අතර එය ගම්මුන් අතර කොටස්වලට බෙදා ගෙන තිබුණි. මෙම සහයෝගීතාවය පිටුපස ඇති ඥාණාන්විත හේතුව වූයේ අවට වනාන්තරය ආරක්ෂා කිරීමට ඇති බලවත් ඕනෑකමයි. සෑම ගැමියෙකුටම තමන්ගේම ඉඩම් කැබැල්ලක් වගා කිරීම සඳහා එළිපෙහෙළි කිරීමට ඉඩ දුන්නේ නම්, වනාන්තරය ඉක්මනින් අතුරුදහන් වීමට ඉඩ තිබෙනු ඇත. මේ අනුව, සාමූහිකව වගා කිරීම සඳහා ගැමියන් විසින් එක් භූමි ප්‍රදේශයක් තෝරාගෙන අස්වැන්න බෙදා ගැනීම සිදු කරන ලදී.

කාලය ගතවත්ම විවිධ භාවිතයන් සහ තාක්ෂණයන් පිළිබඳ දැනුම ගොඩනැගී ඇත. ධාන්‍ය පරිභෝජනය සඳහා මෙන්ම බීජ අවශ්‍යතා සඳහාද ගුණාත්මක එමෙන්ම පරිහානියකින් තොරව ගබඩා කළ යුතු ආකාරය පිළිබඳ හොඳම භාවිතයන් ඔවුහු වටහා ගත්හ. පරම්පරා ගණනාවක් තිස්සේ අත්විඳින ලද විපත්, කරදර, අසාර්ථකත්වය සහ සාර්ථකත්වයන් සමඟ සම්බන්ධවී විශ්වාසයන් ගොඩනැගිනි. ඔවුහු වනාන්තරය, ජල පෝෂක ප්‍රදේශ, ඖෂධ වර්ග, විවිධ පූජනීය ස්ථාන සහ ද්‍රව්‍යයන්ද ආරක්ෂා කළහ. ප්‍රජාව විසින් ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී සිදු කළ යුතු බොහෝ ක්‍රියාවන් සමඟ කටයුතු කිරීම සඳහා සරල මෙවලම් සහ උපකරණ සකස් කරගන්නා ලදී. ආගමික උත්සව විවිධ අරමුණු ඇතිව සංවිධානය කරන ලද නමුත් ඒවායින් සමාජයික ශක්තිය සහ ස්වයං පෙළඹවීම ගොඩනැගිනි. නිවාස ඉදිකිරීම, හස්ත කර්මාන්ත සහ වෙනත් ශිල්පීය කර්මාන්ත සඳහා භාවිත කිරීමට ස්වභාවික පරිසරයෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගැනීමට හැකිවිය.

**ඓතිහාසික කරුණු**

පශ්චිම ප්‍රාග් ඓතිහාසික යුගයේ (ක්‍රි.පූ. 3000-1000) සංජානන හැකියාවන් සහ



තාක්ෂණයේ ප්‍රගතිශීලී ඉදිරි ගමනත් සමඟ මිනිසා සහ පරිසරය අතර අන්තර් ක්‍රියාකාරී සමතුලිතතාවයේ විප්ලවය සඳහා වේදිකාව සකස් විය. මිනිසුන් ක්‍රමානුකූලව ස්වභාව ධර්මයේ ආධිපත්‍යය දැරීමටත් සාමූහික කැමැත්තෙන් එය වෙනස් කරගැනීමටත් කටයුතු කළහ. ක්‍රි.පූ. 1000 දී පමණ ශ්‍රී ලංකාවේ මතුවූ යකඩ තාක්ෂණයේ ප්‍රගමනය මිනිසාගේ මෙම නැඹීමට සාක්ෂි දරයි. අනුරාධපුර ඇතුළු නුවර කැණීම් මගින් යකඩ තාක්ෂණය, අශ්වයන් සහ ගවයන් බෝ කිරීම සහ වී වගාව පිළිබඳ වැදගත් සාක්ෂි පොළව මතුපිට සිට මීටර් දහයක් පමණ ගැඹුරින් හමුවී ඇත. වී වගාව ආශ්‍රිත ජල කළමනාකරණය පිළිබඳ අනියම් සාක්ෂිද (සත්ව, අවසාදිත) හමුව ඇත. සෘතුමය වර්ෂාපතනය, ඇළ දොළ සහ නිත්‍ය ගංගාවලින් ලද සැපයුම් පාලනය කිරීම සඳහා ජල කළමනාකරණ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂිකර්මාන්තය වී වගාව ප්‍රධාන කොටගත් භාවිතයක් ලෙස පැවතුන බැව් සිතිය හැක.

පූර්ව ජල ශිෂ්ටාචාර, සමාජ ඉඩම් පරිහරණ සහ කෘෂිකාර්මික ගුණාංගවල අද්විතීය එකලස් කිරීම් හරහා කුඩා වාරිමාර්ග පද්ධති මත සමෘද්ධිමත් විය. සමහර විට මෙම පද්ධති ප්‍රාථමික වැසිදිය ගොවිතැනින් පෝෂණය වූ කෘෂිකර්මාන්තයේ සිට කුඩා පරිමාණ වාරිමාර්ග බවට පරිණාමය වූ අතර එමඟින් ප්‍රධාන වාරි පද්ධති දක්වා විකාශනය වන්නට ඇත. මෙම ජලවිද්‍යාත්මක පදනම මගින් පහසු කරන ලද ස්ථානගත ජීවන රටාව ඉඩම් හිමිකම, දේපල උරුමය සහ සමාජ සංවිධාන සියවස් ගණනාවක් තිස්සේ පැවතුනි. වාරි පද්ධතිවල විශාලත්වය සහ සංකීර්ණත්වය වැඩි වීමත් සමඟ ප්‍රජා නායකත්ව රටාවන් ශක්තිමත් සහ එලදායී විය යුතු විය. මෙම තත්වයන් අවසානයේ පෙරදිග ඒකාධිපතිත්වයේ ස්වරූපයක් නියෝජනය කරන මධ්‍යගත අධිකාරියට හේතු විය.

දිගු දුරකට වාරි ජලය ප්‍රවාහනය කිරීම සඳහා පද්ධතියේ ඉහළ සහ පහළ අතර ජලය බෙදා හැරීම පිළිබඳ කාර්යක්ෂම පාලනයක් අවශ්‍ය විය. සියලුම ජලවිද්‍යාත්මක ව්‍යුහයන්ගේ සුමට ක්‍රියාකාරිත්වයට කාර්යක්ෂම නඩත්තුවක් අවශ්‍ය වේ. ක්ෂුද්‍ර ජල පෝෂක මත රඳා පවතින වාරිමාර්ග සඳහා රොන්මඩ අඩු කිරීමට සහ පෝෂක ජල අස්වැන්න සහතික කිරීමට ප්‍රවේශමෙන් ජල පෝෂක කළමනාකරණය අවශ්‍ය විය. මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා සියවස් ගණනාවක් පුරා ගොඩනැගුණු ගොඩබිම් හා ජල පරිහරණ ක්‍රමය සංවර්ධනය වී ඇත්තේ එල්ලංගා පද්ධතියක් ලෙසය.

ක්ෂුද්‍ර ජල පෝෂක තුළ එල්ලංගා අනුපිළිවෙලකට කුඩා වැව් සංවිධානය

කිරීම මගින් ජලය භාවිතයේ වැඩි කාර්යක්ෂමතාවයක් ලබා ගැනීමට හැකි විය. එල්ලංගාවේ ඉහළ කොටසේ කුඹුරුවල ජලාපවහනය පහළ කුඹුරුවල නැවත භාවිතය සඳහා පහළ වැවකට ගලා යයි. පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි.ව. 1153 - 1186) සුප්‍රසිද්ධ ප්‍රකාශය " වර්ෂාවෙන් පොළවට වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනය සඳහා නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතු" යන්න මෙම ක්‍රමය මගින් සම්පූර්ණයෙන්ම ප්‍රකාශිතවේ.

බුදුදහමේ දේශනා වී ඇති අන්දමට සහ නායකයන්ගේ සහ බහුතර ජනතාවගේ විශ්වාසයට අනුව වනාන්තර ඇති කිරීම හා පොකුණු, ජලාශ, වාරි පද්ධති ඉදිකිරීම මහා පින්කම් ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ජල සම්පත් සංවර්ධනයට දායක වූ රජවරුන්ගේ විවිධ වාරි ඉදිකිරීම්වලින් සමන්විතය. පළමු සියවසේ සිට වසභ (ක්‍රි.ව. 67-111), මහාසේන (ක්‍රි.ව. 276-303), ධාතුසේන (ක්‍රි.ව. 455-473), II අග්බෝ (ක්‍රි.ව. 575-608), පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153-1186) වැනි රජවරුන් විසින් මෙම වාරි පද්ධති බොහොමයක් ඉදිකරන ලදී. වියළි කලාපයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පෝෂණය කරන්නේ මෙම ජලාශ සහ වාරි පද්ධති මගිනි. මේවායේ ඉදිකිරීම සහ නඩත්තු කිරීමේ දැවැන්ත ව්‍යාපාර බවට පත් විය. ශතවර්ෂ ගණනාවක් පුරා දේශීය විශේෂඥ තාක්ෂණ දැනුමක් ඔස්සේ එම ව්‍යාපාර වර්ධනය වූ අතර, එය දකුණු ආසියාවේ අනෙකුත් රටවල් විසින් වරින් වර යොදාගත් බවක් පෙනේ.

වියළි කලාපයේ ඉපැරණි ජල ශිෂ්ටාචාරය ක්‍රිස්තු වර්ෂ 12 වැනි සියවසෙන් පසු අතුරුදන් විය. දේශගුණික විපර්යාස, මැලේරියාව, පාංශු සාරවත් බව හීන වීම, විදේශ ආක්‍රමණ සහ සාගතය ඊට හේතු ලෙස දක්වා ඇත. මෙම විශිෂ්ට වාරි කළමනාකරණ පද්ධතියේ බිඳවැටීමට හේතුවන්නට ඇත්තේ දකුණු ඉන්දීය හමුදා ආක්‍රමණය කිරීමෙන් කුලවංශිකයින්ගේ (වාරිමාර්ග විශේෂඥතාව හිමි වියලි කලාපීය වංශාධිපතියන්) පරම්පරාව විනාශ වීම නිසාද විය හැකිය.

## ඉඩම් පරිහරණ උපාය මාර්ග

සම්ප්‍රදායික කෘෂිකර්මාන්තය වඩාත් යථාර්ථවාදී මූලධර්මයන් මත පදනම් වූවකි. මිනිසුන් තමන් වටා ක්‍රියාත්මක වන ස්වභාවික සංසිද්ධි නිරීක්ෂණය කළ අතර එය තම අවශ්‍යතා සඳහා හැසිරවිය හැකි ආකාරයද අධ්‍යයනය කළහ. වනාන්තරය, එහි රූපානුව්‍යුහය, සහජීවනය සඳහා විවිධ විශේෂයන් ඇසුරු කිරීම, ගින්නෙන් පසු පුනර්ජීවනය, අවකාශීය වෙනස්කම් ආදිය ඔවුන්ට දැකගත හැකි විය. හේන්, වී සහ ගෙවතු වගාව ඇතුළත් ගොවිතැන් ක්‍රමය පරිසරය සමඟ මිනිසාගේ අන්තර්ක්‍රියා සහ ස්වභාවික පරිසර පද්ධති සමඟ එකඟව වර්ධනය විය. වර්ෂාපතන රටාව, සුළඟ, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය සහ පාංශු හැසිරීම් පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් සහ නිරීක්ෂණ, ඔවුන්ගේ වගා කටයුතු සකස් කිරීමට භාවිතා කර ඇත. ගොවිතැන් කිරීමේදී ඔවුන් මුහුණ දෙන සමහර බාධාවන් ඔවුන්ගේ පාලනයෙන් ඔබ්බට හේතුවන බව



සොයා ගත් විට, ඔවුන් ආගමෙන් සහ අධ්‍යාත්මික හා විශ්වීය බලපෑම්වලින් සහාය ඉල්ලා සිටියහ. ගොවිතැනට යොදවන සම්පත්වලට නිසි ගෞරවයක් නොදක්වා තම ආහාර මූලාශ්‍රවල තිරසාර බව අපේක්ෂා කළ නොහැකි බව ඔවුන් අන් අයට වඩා අවබෝධ කරගත් වැදගත්ම කරුණයි. සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයට සම්බන්ධ ඉඩම් පරිහරණය මගින් ස්වභාවික පරිසර පද්ධතිවල සිට කෘෂි පරිසර පද්ධති බවට පරිවර්තනය වූ අභියෝගාත්මක පරිසරයක සම්පත් කළමනාකරණය පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති විය. පුරාණ කාලයේ ඒකාබද්ධ ඉඩම් හා ජල සම්පත් කළමනාකරණය ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ තුළ ඉඩම් පරිහරණය කලාපකරණයෙන් පිළිබිඹු වේ. වැව් සහ කුඹුරු නිම්නවල ඇති දුර්වල ජලාපවහනය සහිත අව හියුමික් ග්ලේ (LHG) පසෙහි වී වගාව හැර වෙනත් වගාවන් සඳහා ඇත්තේ සීමිත හැකියාවකි. බොහෝ විට ගල් පර්වත සහ කුඩා ගල්කුළු වලින් වැසී ගිය කඳු මුදුන් කලා කෘති සහ ආගමික ස්ථාන සහ අධ්‍යාත්මික පසුබිම් බවට පරිවර්තනය විය. බුදුදහමේ බලපෑම ඉතිහාසයේ මුල් කාලයේ අභයභූමි පිහිටුවීමට සහ වනජීවී සංරක්ෂණයට හේතුවිය.

## තුන් පත් ගොවිතැන

කෘෂිකාර්මික ක්‍රමය එහි තුන් පත් භූමි පරිහරණ රටාව මගින් විදහා දැක්වෙයි. ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාර බෝගය වන සහල් ප්‍රධාන වශයෙන් මහ කන්නයේ දී සහ සමහර විට යල කන්නයේ දී වැවේ ඇති ජලය මත පදනම්ව වාරි ජලය සැපයිය හැකි පහත් බිම්වල වගා කෙරේ. මේ ගම්මානය (ගං-ගොඩ) සාමාන්‍යයෙන් වැවට පහළින් වී වගා කරන ප්‍රදේශය (වෙල්-යාය) දෙපස පිහිටා ඇති අතර බහු වාර්ෂික බෝග සහ එළවළු වලින් එහි වගා කෙරේ. වැව් ජලයේ බලපෑම සහ පහත් බිමේ පිහිටීම නිසා පස අසම්පූර්ණ ජලවහනයෙන් යුක්ත බැවින් අඹ, කොස්, පොල් වැනි බොහෝ පලතුරු බෝග සහ සමහර එළවළුද මෙම ගංගොඩේ පහසුවෙන් වගා කෙරේ. ඍජු

වර්ෂාපතනය භාවිතා කරන වියළි කලාපීය ගම්වාසීන්ගේ පැරණිතම ගොඩ ගොවිතැන වන්නේ තුන්වන සංරචකය වන හේන් ය. තවද, තුන් වැදෑරුම් රටාවට අමතරව එළහරක් සහ මී හරක් සම්ප්‍රදායික ගොවිතැන් ක්‍රමයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන්, ග්‍රාමීය ප්‍රජාවන් විසින් අනුගමනය කරන ලද සමහර උපාය මාර්ග පහත සඳහන් වේ.

1.වර්ෂාපතනය, නියඟය, පළිබෝධ සහ රෝග, වන සතුන්ගෙන් වන හානි ආදි සාධක නිසා ඇතිවන ගොවිතැන් කිරීමේ අවදානම, ගොවිතැන් කටයුතුවල දී සුබ හෝරාවන් සහ ආධ්‍යාත්මික බලය යොදා ගැනීම, කලට වේලාවට වගා කිරීම, බෝග කළමනාකරණය යනාදියෙන් අඩු කරගත හැකි විය.

2.අදාළ සංරක්ෂණ පිළිවෙත් අනුගමනය කරමින් බෝග සඳහා හිතකර පරිසරයක් පවත්වාගෙන යාම.

3.පසට අවමලෙස බාධාකරමින් හා කාබනික ජෛව ස්කන්ධ එකතු කරමින් ගොවිතැන් පිළිවෙත් සකස් කිරීම තුළින් ඉඩම් ඵලදායිතාව පවත්වා ගැනීම.

4.දේශගුණය, පස සහ අනෙකුත් ජීව විද්‍යාත්මක මෙන්ම අජීවී ආතතීන්ගේ විචලනයට මුහුණ දීම සඳහා කෘෂිකර්මාන්තයේ විවිධ බෝග සංයෝජන අනුගමනය කිරීම.

5.අඩු බලශක්ති පරිභෝජනයක් සහිත සරල ගොවිපල උපකරණ භාවිතය

6.වගාවේ යෙදවුම් අවම භාවිතය සඳහා ස්වභාවික ක්‍රියාවලීන් භාවිතා කිරීම. එනම් බෝග විවිධත්වය හඳුන්වා දීම සහ නඩත්තු කිරීම (පළිබෝධ ආක්‍රමණ අවම කිරීම සඳහා), සාරවත් බව වැඩි දියුණු කිරීම සඳහා වවුලන් ආකර්ශනය කර ගැනීම සඳහා මී ගස් (*Madhuca longifolia*) සිටුවීම, ජල ස්කන්ධය සංරක්ෂණය සඳහා වැව වටා ස්වභාවික වෘක්ෂලතා නඩත්තු කිරීම යනාදිය.

සෑම ගොවියෙකුටම වාරි ජලය සඳහා සමාන ප්‍රවේශයක් සහ අයිතියක් ඇතිවන පරිදි කුඹුරු යායේ ඉඩම් අයිතිය ගම්වැසියන් අතර බෙදා හරිනු ලැබේ. ජල හිඟ කාලවලදී (බෙත්ම වගාව) ගොවීන් අතර සමානුපාතිකව බෙදා හරින ලද කුඹුරු කොටසක් වගා කිරීම පිළිබඳ තීරණ ගැනීම ඔවුන්ගේ එකමුතුකමට හොඳ උදාහරණයකි. අධික වියළි කාලවලදී වැව තුළට අවසාදිත ගලා ඒම වැළැක්වීමට ප්‍රමාණවත් පූර්වාරක්ෂාවක් ගනිමින් වැව් ඉහත්තා ප්‍රදේශය තාවුළු ගොවිතැන ලෙස වගා කිරීම ඔවුන්ගේ වගා ප්‍රඥාව පෙන්නුම් කරන උදාහරණයකි.

විවිධ නම්වලින් හඳුන්වන බොහෝ නිවර්තන රටවල සම්ප්‍රදායිකව තැන්මාරු වගාව සිදු කෙරේ. කෙසේ වෙතත්, හේන් පරිණාමනයේදී ලබාගත් සාම්ප්‍රදායික දැනුම තුළ ස්වභාවික සම්පත් සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා වැදගත් පරිසර ගුණාංග රාශියක් අඩංගුවී ඇත. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ හේන් ඉඩම් එළි පෙහෙළි කිරීම ආරම්භ වන්නේ වර්ෂා රහිත වියළි මාසයක් වන ජූලි හෝ අගෝස්තු මාසයේදීවන අතර ගොවීන් කපා ගොඩ ගසන ලද වියළි වෘක්ෂලතාදිය පුළුස්සා බිම සකස් කරති. ඔවුන් පළමු වර්ෂාව අපේක්ෂා කරන සැප්තැම්බර් මැද භාගයට පෙර ඉඩම් සකස් කිරීම සම්පූර්ණ කරයි. හේන්වල සාමාන්‍යයෙන් මහ කන්නය ආරම්භයේදී කුරක්කන්, බඩඉරිඟු, මුං, අබ, එළවළු ආදී විවිධ බෝග වගා කෙරේ.

යල කන්නයේදී හේන්වල තල, මෙනේරි සහ ධාන්‍ය වර්ග වගා කෙරේ. කන්න කිහිපයක වගාවෙන් පසු ඉඩම පුරන් වීමට ඉඩහරී. වියළි කලාපයේ, වනාන්තර ඉඩම් බහුලව පවතින ප්‍රදේශවල, හේන් වගාවේ ඉඩම් පරිහරණයේ තීව්‍රතාවය සියයට 10 කට වඩා වැඩි නොවේ.

හේන් වගාව සඳහා සුදුසු ඉඩමක් හඳුනා ගැනීම, බෝග තෝරා ගැනීම, ඉඩම් කොටස පිරිස අතර බෙදා ගැනීම, වගා කරන කාලය, බෝග කළමනාකරණය, ආරක්ෂාව සහ හේන් තුළ සිදුවන අනෙකුත් සියලු කටයුතු හුදෙක් විද්‍යාත්මක හේතු මත පදනම් වේ.

## උඩරට ගොවිතැන

කඳුකර ප්‍රදේශයේ ජනතාව තෙත් සහ වඩාත් රළු භූමි ප්‍රදේශවලට ගැළපෙන පරිදි තම ජීවිතය වෙනස් කර ගත්හ. කඳු බෑවුම්වල ඇති උල්පත්වලින් ජලය එක්රැස් කරන ලද ඇළ මාර්ග හරහා වියළි කාලවලදී දෙනියේ (නිම්න පතුලේ) වී ගොවිතැන සඳහා වාරි ජලය සපයා ගන්නා ලදී. කඳුකරය ජලාශවල කාර්යය ඉටු කරන අතර ජල පෝෂක කළමනාකරණය කෘෂිකාර්මික ව්‍යවසායයේ අනිවාර්ය අංගයක් විය. ඕවිට, ඕවිල්ල, ඕවිල්කන්ද ආදී ග්‍රාම නාමවලින් ඒවායේ පිහිටීම අනුව පිළිබිඹු වන පරිදි බෑවුම්වල විවිධ පාරිසරික කොටස් හඳුනා ගන්නා ලදී. ජනාවාස ඇති වූ නිම්න පතුල දෙණිය (ගුරුදෙණිය, අලදෙණිය, පේරාදෙණිය) යන උපසර්ගයෙන් නිම්නයෙන් නම් කරන ලදී. කැටිනාවේ පහළ කොටසෙහි, ගෙවතුවල වන උයන් සංවර්ධනය කරන ලදී. තව දුරටත්, හේන් වගාව බොහෝ දුරට තිරසාර පදනමක් මත ඉඳහිට සිදු කරන ලදී. කඳු මුදුන් ස්ථිර ලෙස ඝන වනාන්තර ආවරණයක් යටතේ තබා ඇති අතර, එය පාංශු ඛාදනය පාලනය කිරීමට සහ ජල ප්‍රවාහය නියාමනය කිරීමට උපකාරී විය.

උඩරට බිම් සමහරක් විවිධ පලතුරු වර්ග සහ සාදික්කා, කරාබුනැටි වැනි ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් වන අනෙකුත් ගස් විශේෂවලින් සමන්විත මිනිසා විසින් සාදන ලද වනාන්තර බවට පත් විය. එය ස්වභාවික වනාන්තරයේ විවිධත්වය සහ සංකීර්ණ අන්තර් සබඳතාවයන් අත්‍යවශ්‍යයෙන්ම අනුගමනය විය. උඩරට වනාන්තර උද්‍යාන පිහිටා ඇත්තේ නිම්නයේ පතුල සහ උස් බෑවුම් අතර තෙත් තත්ත්වයන් මඟහරවා ගැනීමට සහ

ගැඹුරු පාංශු ආවරණයකින් සහ ඉහළ ප්‍රදේශවලින් තෙතමනය කාන්දු වීමෙන් ප්‍රයෝජන ගැනීමට ය. උඩරට ගෙවත්තක ක්ෂුද්‍ර පරිසරය තෙත් කඳුකර පසුබිමක මිනිස් ජනාවාස ප්‍රජාවට සුදුසු පදනමක් සැපයීය.

තෙත් කලාපයේ ගොවිතැන් ක්‍රමය ප්‍රධාන වශයෙන් භූ විෂමතාවය, දේශගුණය, පස සහ අනෙකුත් භූගෝලීය සහ පාරිසරික ලක්ෂණ අනුව සැකසිනි. භූ දර්ශනයේ ඉහළ කොටස බොහෝ දුරට ස්වභාවික වෘක්ෂලතාවලින් සමන්විත වන අතර එය තෘණ බිම්වල සිට ඝන වනාන්තර ආවරණය දක්වා වෙනස් වේ. ඊට පහළින් ඝන වියන සහිත ගෙවතු පිහිටා ඇති අතර එහිදී ආර්ථික වැදගත්කමක් ඇති ගස්, පඳුරු සහ ඖෂධ විශේෂ වලින් සමන්විත විවිධ වියන් ස්ථර මගින් ස්ථරීකරණයක් දැකිය හැක. මෙම වනාන්තර ගෙවතු දැව ගස් විශේෂ, පලතුරු ගස්, මුල් සහ අල බෝග, එළවළු සහ ඖෂධ පැළෑටි වලින් සමන්විත වේ. එබැවින් ස්වභාවික වනාන්තර මගින් සපයනු ලබන සියලුම සංරක්ෂණ හා ආරක්ෂණ කාර්යයන් මෙම වනාන්තර ගෙවතු මගින් ද සපයනු ලැබේ. එබැවින් මධ්‍යම හා උස් ප්‍රදේශවල දක්නට ලැබෙන වනාන්තර ගෙවතු ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික තිරසාරභාවය සහ පාරිසරික තිරසාරභාවය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

භූමි තත්ත්වයට අනුව මෙම වනාන්තර ගෙවතුවලට පහළින් හෙල්මළු සහිත ඉඩම්වල කුඹුරු පිහිටා ඇත. වනගත ගෙවතු සහ වෙල්යායේ ඉහළ ප්‍රදේශයේ පිහිටා ඇති ස්වභාවික වන ආවරණ ජලය සංරක්ෂණය කිරීමට සහ ගබඩා කිරීමට උපකාරී වන අතර, එය වසරේ වියළි කාලවලදී වී වගාව සඳහා සහ ජලාධාරයන්හි වියළි කාල ප්‍රවාහය පවත්වා ගැනීමට භාවිතා කළ හැකිය. මේ ප්‍රදේශවල කුඹුරු වර්ග දෙකකි. එකක් පෝෂණය වන්නේ තමන්ගේම උල්පත් මගිනි. අනෙක ඔයකින් ජලය හරවාගෙන වගා කෙරේ. සාම්ප්‍රදායිකව මෙම ප්‍රදේශවල ජීවත් වූ ගම්වැසියන් ස්වයංපෝෂිත වූයේ කුඹුරුවලින් සහල් සපයාගැනීමත් එළවළු, පලතුරු, බෙහෙත්, දර, දැව ආදී අනෙකුත් අවශ්‍යතා වන ගෙවතුවලින් සපුරා ගැනීමත් හේතුවෙනි.

කඳුකරයේ, ජල මූලාශ්‍රය ළිං හෝ වැව් වලින් නොව, උල්පත් හෝ ඇළ දොළ මගින් සැකසෙන අතර, ඒවා ඉහළ කඳු බෑවුම්වල වනාන්තර ආවරණය නිසා බොහෝ දුරට නිත්‍ය ජල මූලාශ්‍රවේ. වී වගා කරනු ලැබුවේ එම ප්‍රභවයන් හරහා කුඩා වේලි හෝ අමුණු ඉදි කිරීම මගින් එම ප්‍රභවයන්ගෙන් ලැබෙන ජලය සමඟිනි. මෙම පොකුණුවලට අමතරව ඒ අසල පිහිටි පතහ නම් වූ දිය උල්පත් ද භාවිත විය. මෙම ප්‍රදේශයේ ඇති සුවිශේෂී සංස්කෘතිය වන්නේ වනාන්තර උද්‍යාන හෝ සාදෘශ්‍යය වනාන්තර ලෙස හැඳින්විය හැකි සුප්‍රසිද්ධ උඩරට ආර්ථිකමය ගෙවතු ය.

## සම්ප්‍රදායික කෘෂිකර්මයේ ත්‍රිමාණ දිශානතිය

සම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ සියවස් ගණනාවක් පුරා විකාශනය වූ දේශීය දැනුම, ආගමික හා අධ්‍යාත්මික සම්භවය, විශ්වීය බලපෑම (ජ්‍යොතිෂය) සහ ස්වාභාවික සංසිද්ධි වලින් ලබාගත් බොහෝ අංශවල මිශ්‍රණයකි. සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ සුන්දරත්වය නම් එය බොහෝ අවස්ථාවලදී ස්වභාවධර්මයේ නීති රීති, මූලධර්ම සහ සංසිද්ධීන් අනුගමනය කර තිබීමයි. ස්වාභාවික සිදුවීම්වල හදිසි කම්පන ඉවසා දරා ගනිමින් ඉතා කටුක දේශගුණික තත්ත්වයන් යටතේ සියවස් ගණනාවක් පුරා පැවති මෙම පද්ධතිවල තිරසාරභාවය සහ පාරිසරික ගැළපුම සඳහා වැදගත්ම හේතුව මෙයයි.

බටහිර කෘෂිකර්මාන්තයේ මෙන් නොව, සම්ප්‍රදායික කෘෂිකර්මය ජීව භෞතික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස පමණක් පරිණාමය වී නැත.




රූපය 1. සාම්ප්‍රදායික කෘෂිකර්මයේ ත්‍රිමාණ දිශානතිය

එය සමාජ-සංස්කෘතික සහ විශ්ව-ආධ්‍යාත්මික අංශ සමග මුසු වී ඇත (රූපය 1).

අතීතයේ ග්‍රාමීය ප්‍රජාවන් අතර දක්නට ලැබුණු බොහෝ කෘෂිකාර්මික පිළිවෙත්, දේශගුණය, වනසත්ව සහ වෙනත් ස්වභාවික විපත් හේතුවෙන් සිදුවන වගා හානි සහ අසාර්ථකවීම් අවම කරගැනීම අරමුණු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, හරිත විප්ලවය දියත් කිරීම සහ බටහිර සංස්කෘතිය ග්‍රාමීය ජීවිතයට ඇතුළු වීමත් සමඟ සියවස් ගණනාවක් පැරණි සාම්ප්‍රදායික ප්‍රඥාව බොහෝ දුරට සඳහටම අතුරුදහන් වීමට පටන් ගත්තේය.

වන සතුන්ගෙන් බෝග ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරන ලද සාම්ප්‍රදායික පිළිවෙත් වර්ග තුනක් ඇත. පළමු කණ්ඩායම ජ්‍යොතිෂය ශාස්ත්‍රය මත පදනම් වන අතර, දෙවැන්න ආත්මයන් සහ දෙවියන්ගේ බලයන් මතද, තුන්වන කණ්ඩායමට පද ගායනා කිරීම සහ විශේෂිත සංකේත භාවිතා කිරීමද ඇතුළත් වේ. බොහෝ විට මෙම විවිධ භාවිතයන් ඒකාබද්ධව සිදුකරයි.

**ජ්‍යොතිෂය ශාස්ත්‍රය** - ජ්‍යොතිෂය ශාස්ත්‍රය භාවිතය සඳහා එක් උදාහරණයක් වන්නේ වගා කාලයයි.

i.වැට බැඳීම - සඳුදා, හිරු උදාවට පැය භාගයකට පෙර, ගස් අත්තක් කෙටි කුරු හතරකට කපා ඉන් කුරු තුනක් නැගෙනහිර දෙසට මුහුණලාද හතරවන කුර වැල් (කිරිවැල්) වලින් අනෙක් ඒවා හරහා බඳිනු ලැබේ.

ii.කුඩා ප්‍රදේශයක් පිරිසිදු කර බීජ කිහිපයක් වපුරා වගා කාලය ආරම්භ කරනු ලැබේ.

**ආත්ම සහ දෙවිවරුන්** - වෙනත් උපාය මාර්ග වලින් ගැටලුව විසඳිය නොහැකි බව ඔවුන් තේරුම් ගත්විට දෙවියන්ගේ සහ ආත්මයන්ගේ සහාය අපේක්ෂා කරයි. එවැනි එක් උදාහරණයක් නම් සියලුම ගොවීන් තම වගාව ආරම්භ කිරීමට පෙර පන්සලට ගොස් පුද පූජා පැවැත්වීමයි. ඊට පසු දෙවියන් සතුටු කිරීම උදෙසා පොල් ගෙඩියක් එල්ලීම සිදු කරනු ලැබේ. අස්වැන්න නෙලීමෙන් පසු, ආහාරයට භාවිතා කිරීමට පෙර ගොවිබිමේ විවිධ චාරිත්‍ර සිදු කරති. එවැනි ක්‍රියාවලින් අදෘශ්‍යමාන බලවේග සතුටු කළ හැකි බව ඔවුහු විශ්වාස කළහ. තවමත් සමහර පිටිසර ගම්මානවල මේ කටයුතු සිදුවෙමින් පැවතුනද එහි විද්‍යාත්මක පසුබිම පිළිබඳ සිතීම උගහටය.

**පිරිත්** - බෞද්ධ ඉගැන්වීම් වලින් උපුටා ගත් නිශ්චිත ගාථා සජ්ඣායනා කිරීම කණ්ඩායමක් ලෙස සිදු කෙරේ. වැලි සහ ජලය ආකර්ශනීය කිරීමට පද භාවිතා වේ. සමහර ප්‍රදේශවල සංකේත තල් කොළයක ඇඳ කුඹුරේ කොනක එල්ලා තිබේ. කෙසේ වෙතත්, එය සිදුකරන්නා දැහැමි ජීවිතයක් ගත කරන බව කියනු ලබන අතර ඔහු මංකොල්ලකෑම්, ලිංගික හැසිරීම්, මාංශ අනුභවය හෝ මත්පැන් පානය කිරීමෙන් වැළකී සිටිය යුතුය.

**මන්ත්‍ර** - මන්ත්‍ර ජපකිරීම නිශ්චිත වාර ගණනක් සිදු කරමින් නිශ්චිත ශබ්ද සමග ජප කරයි. මෙය පරිසරයේ කම්පනයක් ඇති කරන්නේ යයි බලාපොරොත්තු වේ.

**යන්ත්‍ර** - කිසියම් ආත්මයක් සඳහා සංකේතාත්මක චිත්‍රයක් එල්ලා හෝ නිශ්චිත ස්ථානයක තබා ඇත්තේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිදු කිරීමට හෝ කිසිදු තර්ජනයකින් තොරව ජීවත් වීමට අදෘශ්‍යමාන බලයේ ආශිර්වාදය අපේක්ෂාවෙනි.

## ආපදා අවදානම අවම කිරීම

වර්ෂා පෝෂිත තත්ත්වයන් යටතේ හෝ විවිධ ප්‍රමාණයේ ජලාශවලින් ලබාගන්නා වාරි ජලයෙන් වී වගා කිරීම ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපවල තිරසාර ගොවිතැන් ක්‍රමයක් බවට පරිණාමනය විය. ගොවීන් මුහුණ දෙන මූලික ගැටලු වූයේ අඩු වර්ෂා කාලවලදී ජලය හිඟවීම, ක්ෂේත්‍රයේ ඇතැම් ස්ථානවල ලවණතාව වර්ධනය වීම සහ වන සතුන්ගෙන් හානි, පළිබෝධ සහ රෝග යන්ය. ජලය පිළිබඳ ගැටලු විසඳීම සඳහා මතු වූ උපාය මාර්ග කිසියම් ගැටලුවකට විශේෂිත වූවක් නොව සාමූහික වූවකි. පහත සඳහන් වන්නේ එවැනි උපාය මාර්ගයන්ය.

i. 'බෙත්ම' පිළිවෙත - නියං කාලවලදී වැවක (ජලාශයේ) පෝෂිත ප්‍රදේශයේ (භූමියෙහි) කොටසක කොටස් හිමියන් (කුඹුරු ඉඩම් හිමියන්) අතර වගාකිරීම සඳහා තාවකාලිකව ඉඩම් කට්ටි නැවත බෙදා හැරීමේ පුරුද්දකි.

ii. 'පංගු' ක්‍රමය - වැව කැඩීම,




**Q - ජල ප්‍රවාහය, A - කුඹුරු වපසරිය**

**රූපය 2. වාරි ජලය බෙදා හැරීම සඳහා යොදාගත් කරහන**

කාන්දු වීම සහ වැව් බැම්මෙන් උමයෑම වැළැක්වීම සඳහා නිසි ලෙස නඩත්තු කිරීම සිදු කළ යුතු විය. මේ සඳහා වැව් බැම්ම අළුත්වැඩියා කිරීම, රොන්මඩ ඉවත් කිරීම සහ වියළි කාලවලදී ඇළ මාර්ග පිරිසිදු කිරීම යනාදී කාර්යයන් ඉඩම් හිමිකමට සමානුපාතිකව එක් එක් ගොවියා අතර බෙදාහදා ගැනීම සිදු කරයි.

iii. 'කැකුලම' - පෝෂිත ප්‍රදේශයේ වගා කිරීමට වැව්වලට ප්‍රමාණවත් ජලය නොලැබෙන බව හැඟෙන සෑම අවස්ථාවකදීම ගොවීන් මුල් කාලීන වර්ෂාවෙන් වගා කාලය ඉදිරියට ගෙන යයි. සැප්තැම්බර් (දෙවන අන්තර් මෝසම) වර්ෂාපතනය වැඩි නම් වැව පිරවීමට සෘතුමය වර්ෂාපතනය ප්‍රමාණවත් නොවන බව ඔවුන්ට අත්දැකීම් තිබේ.

iv. 'කරහන' - මෙය හතරැස් හැඩැති කැපුම් දෙකක් හෝ තුනක් සහිත කොටයකින් සෑදූ ඇළ හරහා සවි කර ඇති ජල බෙදා හැරීමේ උපකරණයකි (රූපය 2). පහත ඇළ මාර්ගවල ප්‍රවාහ අවශ්‍යතා අනුව කට්ට වල ප්‍රමාණය සහ පහළ මට්ටම සාදා ඇති අතර කරහන සවි කර ඇත්තේ 'ගමරාළ' විසිනි.

v. ගමේ පොදුබිම් - මෙම කුඩා ප්‍රදේශ යොදාගෙන ඇත්තේ වැව් ජල හානිය අවම කිරීම, ලවණතා බලපෑම් අවම




**රූපය 3. වියළි කලාපයේ ආපදා අවදානම අවම කිරීම සඳහා ඉඩම් පරිහරණ කළමනාකරණය**

කිරීම, වැව් අවසාදිත වීම වැළැක්වීම වැනි කාර්යයන් සඳහාවේ. (රූපය 3).

vi. සාම්ප්‍රදායික වැව් ගම්මාන පද්ධතියේ තිරසාර බව අතීතයේ පවත්වා ගෙන ගියේ හුදෙක් ව්‍යුහාත්මක නඩත්තුවෙන් පමණක් නොවේ. පරිසර පද්ධතියේ සෑම අංගයක්ම නිසි ලෙස සලකා බැලීමෙනි. කුඹුරු ඉඩම්, ජනාවාස ප්‍රදේශය, හේන් (තැන් මාරු වගාව) ඉඩම්, වැව ආදී සාර්ව ඉඩම් පරිහරණයන් පිළිබඳව පමණක් නොව ක්ෂුද්‍ර ඉඩම් සම්බන්ධයෙන්ද අවධානය යොමු කෙරිණි.

vii. ගොඩ වල (ඉහත්තා රොන් මඩ උගුල), ඉස්වැටි (ඉහත්තා පස්වැටි), ගස්ගොම්මන (ඉහත්තා ගස් තීරය), පෙරහන (තණ පිටිය), කට්ටකාඩුව (යටාවත රක්ෂිතය), තිස්බඹේ (ගම වටා ඇති බිම් තීරුව), කිවුල්-ඇල යනාදී ඉඩම් භාවිතයන් හිතාමතාම නඩත්තු කර ඇත්තේ මන්දැයි තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. ඒ සඳහා උපකල්පනය කළ හැකි එකම හේතුව වන්නේ නියගය, ගංවතුර, සුළි කුණාටු සහ වසංගත වැනි ස්වභාවික විපත්වල බලපෑම් අවම කිරීමේ ප්‍රඥාව මෙම ප්‍රජාවන්ට තම භූමිය, ජලය සහ වන සම්පත් කළමනාකරණය කිරීමෙන් ඉටුකර ගතහැකි වීමයි. මෙම පොදු

බිම් පිළිබඳ විස්තර සහ වැදගත්කම පහත සාකච්ඡා කෙරේ.

❖ ගස්ගොම්මන (ගස් තීරය) - වැව් පිටියට ඉහළින් පිහිටි ඉහත්තා බිම් තීරුවේ (වාන් ගිල්ම) ස්වභාවිකව වැවෙන වෘක්ෂලතාදිය මෙම තීරයට අයත් වන අතර, වාන් ජලය ඇති විට පමණක් ජලයෙන් යටවේ. කුඹුක්, නබඩ, මයිල, දඹ ආදී විශාල ගස් සහ කයිල, එලිපත්තා, කටුකැළිය, කලවැල්, බොකලවැල් ආදී ලියගොමුද මෙම ප්‍රදේශයේ දක්නට ලැබේ. මෙම වෘක්ෂලතාදිය ස්වභාවික වන අතර බීජ ජලය මත පාවේ. ගස්ගොම්මන සුළං බාධකයක් ලෙස ක්‍රියා කරයි, තද සුළං වල බලපෑම අඩු කරයි, වැවෙහි වාෂ්ප වීම සහ ජලයේ උෂ්ණත්වය අඩු කරයි. එය දෙපැත්තෙන්ම බැම්මට සමීප අතර එහිදී විශාල ගස්වල මුල් ජාල නිර්මානය කරන බැවින් සමහර මත්ස්‍ය විශේෂ සඳහා අභිජනන සහ වාසස්ථාන ඇති කරයි. මෙම ගස් තීරුව මිනිසුන් සහ වන සතුන් අතර භූමිය වෙන් කරන සීමාවද වේ.

❖ පෙරහන (තෘණ පෙරහන) - එය ගස්ගොම්මනට යටින් වැවෙන තණබිම වන අතර උඩාවත හේන් ඉඩම්වලින් ගලා එන අවසාදිත පෙරීම සිදු කරයි. ගංවතුර සහ නියං තර්ජන අවම කරමින් වැවේ ධාරිතාව පවත්වා ගැනීමට මෙය උපකාරී වේ.

❖ ඉස්වැටිය හෝ පොටවැටිය (පාංශු වැටිය) - ඉහළ ඉඩම් බෑවුම්වලින් ඛාදනය වූ පස්, වැවට ඇතුළු වීම වැළැක්වීම සඳහා වැව් බැම්ම දෙපස ඉදිකරන ලද උඩාවත පාංශු වැටිය.

❖ ගොඩවල (මඩ උගුල) - අවසාදිත උගුලට හසු කර ගැනීම සඳහා මිනිසා විසින් සාදන ලද දිය වළක් වන අතර එය වන සතුන්ට ජලය සපයයි. මෙය මනුෂ්‍ය-සත්ව ගැටුම මගහැරීමේ උපාය මාර්ගයක්ද වන්නට ඇත.

❖ තාවුල - වැව් පිටියේ ඉහළ කොටස වන මෙම සමතලා ප්‍රදේශයේ නොගැඹුරු ජල කඳක් දක්නට ලැබේ. මහ වැස්සෙන් පසු මාස 2-3 කින් මෙහි ජලය අතුරුදහන් වේ.

❖ වැව්-පිටිය - මෙය ජලාශයේ ගැඹුරු ප්‍රදේශය වන අතර, වැව් ජලයේ ප්‍රධාන කොටසකට ඉඩ සැලසෙන අතර එය වසරකට මාස 8කට වැඩි කාලයක් ජලයෙන් වැසී පවතී.

❖ මඩ-කළුව - වසරේ වියළි මාසවලදී පවතින ජල ස්කන්ධ කොටස වන මෙය වැව් බැම්මට ආසන්නව පිහිටා ඇත. මෙම ජලය සොරොව්ව හරහා පිටකල නොහැක.

❖ කුළුවැව - විශාල ජලාශ වලට ඉහළින් ඉදිකරන ලද සාපේක්ෂ වශයෙන් කුඩා වැවක්වන මෙය අවසාදිත උගුලට පමණක් නොව ගවයින් සහ වන සතුන් සඳහාද ජලය සැපයේ. කුළුවැව වාරිමාර්ග කටයුතු සඳහා භාවිතා නොවේ.

❖ තිස් බඹේ - එය ජනාවාස ප්‍රදේශය (ගංගොඩ) වටා දක්නට ලැබෙන සාරවත් බිම් තීරුවක් වන අතර එය කිසිදු පුද්ගලයෙකුට අයත් නොවේ. මී, අඹ සහ පොල් ආදී ගස් විශේෂ තැනින් තැන වැඩී ඇත. බොහෝ විට මෙම ප්‍රදේශය සනීපාරක්ෂක කටයුතු සඳහා භාවිතා කරන ලදී. මී හරකුන්ගේ විවේක ස්ථානය ලෙසද, මී හරකුන් සිටීම මගින් වන සතුන්ගෙන් සහ මැලේරියාවෙන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් ලෙසද භාවිතා විය.

❖ කිවුල්-ඇල (ජලාපවහන ඇල) - මෙය පොදු ජලාපවහන ඇල ලෙස භාවිතා කරන අතර වැව ඉදිකිරීමට පෙර පැවති ස්වභාවික ජලමගයි. කරඳ, මී, පන්, ඉකිරි, වැටකෙයා ආදී ගස් විශේෂ ද දුර්ලභ කුඩා මත්ස්‍ය විශේෂ කිහිපයක් ද කිවුල් ඇළ දිගේ ජල වළවල්වල දක්නට ලැබේ. වැදගත්ම දෙය නම් එය ලවණ හා යකඩවලින් දූෂිත ජලය ඉවත් කර කුඹුරුවල ජලාපවහන තත්ත්වය වැඩි දියුණු කිරීමට උපකාරී වීමයි.

❖ කට්ටකාඩුව - මෙය වැව් බැම්මට පහළින් වෙන් කර ඇති ඉඩමකි. එය ක්ෂුද්‍ර දේශගුණික පරිසරයන් හතරකින් සමන්විත වේ. එනම් දියවල, දෙපස වගුරු බිම්, තෙත් බිම් සහ වියළි උස්බිම්ද වේ. එබැවින් මෙහි විවිධ වෘක්ෂලතාදිය හොඳින් වැවේ. මෙම භූමි කළාපය ලවණ සහ යකඩ අයන කුඹුරට ඇතුළු වීම වළක්වයි. යතුරුවල ලෙස හඳුන්වන මෙම දියවල විසින් භූගත ජල මට්ටම ඉහළ නැංවීමෙන් බැම් කාන්දු වීම අවම කරයි. ගැමියන් බැම්මේ ස්ථායීතාවය ශක්තිමත් කිරීම සඳහා බැම්මේ පිටපත්ල දිගේ වැටකෙයා සිටුවයි. ඉන්ධන, දැව, බෙහෙත්, වැටවල්, ගෘහ හා ගොවි උපකරණ, ආහාර, පලතුරු, එළවළු යනාදී අරමුණු සඳහා මිනිසුන් මෙහි වෘක්ෂලතාදියේ විවිධ කොටස් භාවිතා කරන බැවින් ගමේ පොදු උද්‍යානයක් ලෙස මෙය භාවිතා කල බව පෙනේ. විශේෂයෙන් ඔවුන් ගෘහ කර්මාන්ත සඳහා මෙම වෘක්ෂලතාදිය භාවිතා කල බැව් පෙනේ.

## වත්මන් තත්ත්වය

ලේඛනගත නොකළ සම්ප්‍රදායික දැනුම අද සාමාන්‍යයෙන් වෙළඳ රහසකට සමාන "පවුලේ රහසක්" ලෙස පවතී. දැනුම පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වන අතර එය සමීපතමයන්ගෙන් හැර පවුලෙන් පිටත සිටින අයට නොලැබේ. කෙසේ වෙතත් පවුලේ රහස් ලෙස පවත්වාගෙන යන සම්ප්‍රදායික දැනුම කාන්දු වීමට හෝ ක්‍රමයෙන් පොදු ජනතාව වෙත ගලායෑම සිදුවේ.

කෘෂිකර්මය පිළිබඳ විධිමත් නොවන පාරම්පරික දැනුම බොහෝ දුරට දැන් විනාශ වී ගොස් ඇත. සාමාන්‍යයෙන් ප්‍රජාවේ සුළුතරයක් විසින් පරිභෝජනය කරන ආහාර ද්‍රව්‍ය ප්‍රභවයන් කිහිපයක් ඇත. නමුත් මෙම ප්‍රජාවන් පොදු සමාජය තුළටම අවශෝෂණය වීමත් සමඟ මෙම දැනුම ද ප්‍රසිද්ධ වී ඇති අතර පුරුදුද ප්‍රචලිත වී ඇත. අතීතයේ දී සාම්ප්‍රදායික බීජ නිතිපතා භාවිතා කරන ලද නමුත් වසර ගණනාවක් තිස්සේ ඒවා හුවමාරුවීම නැවතී ඇත. හරිත විප්ලවය නිසා අපේ බොහෝ ගොවීන් සාම්ප්‍රදායික සහල්වලින් ඉවත් වී නවීන දෙමුහුන් ප්‍රභේදවලට යොමු වූ අයුරු දැකගත හැකිය. සමහර බීජ දේශීයව සංරක්ෂණය කර ඇති නමුත් ඒවායින් බොහොමයක් ජාත්‍යන්තර බීජ බැංකුවල තැන්පතුවල ඇත. මෙම තැන්පතුවල පවතින සාම්ප්‍රදායික බීජ නව වාණිජ බීජ නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ නම් ශ්‍රී ලංකාවේ පූර්ව

අනුමැතිය ලබා ගැනීමක් හෝ යම් ප්‍රතිලාභයකට හවුල් වීමට හෝ අපේ රටට ඉඩක් නැත.

තිරසර කෘෂිකාර්මික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්ති සංවිධාන තුළ දේශීය දැනුම හඳුනා ගැනීම, ලේඛනගත කිරීම සහ ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ. කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා දේශීය දැනුම් පද්ධතිවලින් රාමුවක් සපයන අතර ඒවා විවිධ ප්‍රතිව්‍යුහගත කිරීම්වලට යොදාගෙන ඇත.



දේශීය දැනුම ඒකාබද්ධ කිරීම තුළින් සංවර්ධනය කරන ලද සහභාගීත්ව තාක්ෂණයන් මගින්:

i) ගොවීන්ට තමන්ගේම තීරණ භාවිතා කර තෝරා ගැනීමට හැකි වන පරිදි විවිධාංගීකරණය වූ තාක්ෂණික විකල්පයන් සැපයීම;

ii) ගොවීන්ගේම දැනුමට අගයක් ලබාදීම

iii) පර්යේෂණ මනසක් ඇති ගොවීන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය මගින් විවිධාංගීකරණය වූ මූලාශ්‍ර භාවිතා කිරීම සිදුකල හැක.

ඉතිහාසය තුළ ජාතිය මුහුණ දුන් අවශ්‍යතා සහ ගැටලු අනුව රටක දේශීය දැනුමේ අන්තර්ගතය වෙනස් වේ. එහි වැදගත්කමේ විවිධත්වය අනුව එය වර්ගීකරණය කළ හැකිය. එය කෘෂිකර්මය, දේශගුණය, ඉතිහාසය, සම්ප්‍රදාය, වෛද්‍ය විද්‍යාව, ආගම සහ ඇදහිල්ල ආදී ප්‍රජාව තුළ ඇති බොහෝ අංශ සඳහා තොරතුරු සපයයි. උදාහරණයක් ලෙස ග්‍රාමීය ජනතාව යම් ප්‍රදේශයක දක්නට ලැබෙන ශාක නිරීක්ෂණය කිරීමෙන් පසෙහි ලවණ තත්ත්වය අවබෝධ කර ගනී. දිවුල්, කීරිය, ඉඳි, ඉකිරිය, පොතුපන්, වැටකෙයා, ඉළුක් ආදිය කිවුල් ඇති බව පෙන්වන දර්ශක ශාකය. ඔවුන් දිවුල් ගස්වල වැඩිපුර මල් නිරීක්ෂණය කළහොත් හොඳ වැසි ඉදිරියට ලැබෙතැයි අපේක්ෂා කෙරේ. බිනර (සැප්තැම්බර්) මාසයේ අධික වර්ෂාපතනයක් ඇතිවීම අඩු වර්ෂාපතනයක් සහිත මහ කන්නයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික දැනුම නවීකරණයත් සමග නැති වී ගොස් ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් සම්ප්‍රදායික දැනුම දරන්නන්ගේ ජීවන රටාවේ වෙනස්කම් වළක්වා ගනිමින් සම්ප්‍රදායික දැනුම සුරැකීමට උත්සාහ කළ යුතුද යන ප්‍රශ්නය මෙයින් මතු වේ. එවැන්නක් තුළින් නවීකරණයේ ප්‍රතිලාභ (ජීවන මට්ටම් වැඩිදියුණු කිරීම, සමාජ සංචලනය යනාදිය) මෙම ප්‍රජාවන්ට අහිමි වීමක් වනු ඇත. නවීන ජීවන රටාවේ ප්‍රතිලාභ සාම්ප්‍රදායික ජීවන රටාවන් සමග සංසන්දනය කොට ප්‍රශ්න කළ හැකි වුවත්, සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා සම්ප්‍රදායික ජීවන රටා සහිත ප්‍රජාවන් නවීකරණය වීම වැළැක්වීම සාධාරණීකරණය කළ නොහැක. පාරම්පරික දැනුම නැතිවීම වැළැක්විය හැක්කේ පාරම්පරික දැනුම ලේඛනගත කිරීමෙනි. කෙසේ වෙතත්, ගතානුගතික බුද්ධිමය ආරක්ෂණ ක්‍රමය විසින් ලේඛනගත කිරීම සඳහා සම්ප්‍රදායික දැනුම හෙළිදරව් කිරීම දිරිමත් නොකරනවා පමණක් නොව සම්ප්‍රදායික දැනුමේ කඩිනම් ලේඛනගත කිරීම අවම කිරීමටද හේතු වන බැව් පෙනේ.

ශ්‍රී ලංකාව තුළ, ස්වදේශීය දැනුම සුරැකීමට මෙතෙක් කිසිදු සාමූහික උත්සාහයක් ගෙන නොමැත. අනෙක් අතට රටේ නීත්‍යානුකූල දැනුම් පද්ධතිය ද වඳවී යාම වේගයෙන් සිදුවෙමින් පවතී. ඉදිරි දශක කිහිපය ඇතුළත බෞද්ධ විහාරස්ථානවල තැනින් තැන ගොඩ ගසා ඇති මෙම දැනුම පිළිබඳ බොහෝ වාර්තා (පුස්කොළ අත්පිටපත්) නොසලකා හැරීම නිසා විනාශ වනු ඇත. ග්‍රන්ථ නාමාවලිය සකස් කිරීමෙන් පමණක් මෙම අත්පිටපත් සංරක්ෂණය නොවේ. ඒවා වහාම පිටපත් කිරීම, වර්ගීකරණය, සුචිගත කිරීම සහ සංරක්ෂණය කිරීම කළ යුතුය.

වාචික සම්ප්‍රේශන සම්ප්‍රදාය නූතන සමාජය තුළ නොපවතින බැවින් රට තුළ ඇති සැබෑ දේශීය දැනුම විශාල ප්‍රමාණයක්, දැනටමත් අතුරුදහන් වී ඇත. වාචික සම්ප්‍රදාය අභාවයට යමින් පවතී. වාචික සම්ප්‍රදායික දැනුම ප්‍රගුණ කිරීමට රටේ තරුණ පරම්පරාව උනන්දු නොවේ. එබැවින් වහා ක්‍රියාමාර්ග නොගතහොත් වත්මන් වැඩිහිටි පරම්පරාව අවසන් වන විට ශ්‍රී ලංකාවේ වාචික දේශීය දැනුම ගිලිහී යාම වැළැක්විය නොහැක. එබැවින්, එය වහාම එකතු කර වාර්තාගතකර සංරක්ෂණය කර අනාගත පරම්පරාවට ලබා දිය යුතුය.

## විවිධත්වය සහ සංරක්ෂණය

බෝග විවිධත්වය යනු හේන් ගොවිතැනේ පළිබෝධ කළමනාකරණය සඳහා අතීතයේ භාවිතා කරන ලද වඩාත්ම ඵලදායී

උපාය මාර්ගයයි. ගෙවතු යනු දැව, පලතුරු, අල වර්ග, ඖෂධීය ශාක, මල්, කුළුබඩු සහ එළවළු ඇතුළු ප්‍රයෝජනවත් ශාක රාශියක් සඳහා බහු වාර්ෂික බෝග වගා කිරීමේ සම්ප්‍රදායික ක්‍රමයකි. ඒවා 5-30% දක්වා බැවුම්වල පිහිටා ඇති අතර, කුඹුරු මිටියාවතේ, ගෙවතු පාමුල පිහිටා ඇත. සාම්ප්‍රදායික ගෙවතුවල බහු-ස්ථර වෘක්ෂලතාදිය ගස්, පඳුරු, වැල් සහ ඖෂධ පැළෑටි වලින් සමන්විත වේ.

පරිසර පද්ධතිවල විවිධත්වය විශාල ජනගහනයක් පවත්වා ගැනීම සඳහා ආහාර නිෂ්පාදනය කළ හැකි කෘෂිකාර්මික පද්ධතියට අනුවර්තනය වීමට ස්වභාවික පසුබිමක් ලබා දුන්නේය. කෘෂිකර්මාන්තයේ සහ ජීවත්වන අයගේ සාම්ප්‍රදායික ප්‍රඥාව දශක කිහිපයක් ඇතුළත පරිණාමනය වූවක් නොවේ. එය පාරිසරික වශයෙන් අනුවර්තනය වූ, ආපදාවලට ඔරොත්තු දෙන සහ තිරසාර ජීවන පද්ධතියක් නිර්මාණය කරන ලද දීර්ඝ කාලයක් තිස්සේ පරීක්ෂාවට ලක්වූ දැනුමකි. ඔවුන්ගේ කෘෂිකර්මාන්තය ඕනෑම කාලගුණික විපර්යාසයක් අවශෝෂණය කර ගැනීම සඳහා වගා කාලය වෙනස් කිරීම සහ ගොවිතැන් පිළිවෙත් තෝරා ගැනීම මගින් සකස් කර ඇත. ඔවුන් හේන් සහ කුඹුරු වගා කළේ වර්ෂා කාලයට අනුවය. අඩුම තරමින් ඔවුන්ට වගාවෙන් සාර්ථක අස්වැන්නක් ලබා ගත හැකිය. කැකුලම, බෙත්ම, තාවුළු ගොවිතැන යනාදිය තම ගොවිතැනට නියං බලපෑම් වළක්වා ගත හැකි විසඳුම් පෙන්වන හොඳම උදාහරණ වේ. සාම්ප්‍රදායික ප්‍රජාවන් පස, ජලය සහ ස්වභාවික වාසස්ථාන සංරක්ෂණය කිරීමට සෑම උත්සාහයක්ම ගත්හ. ආහාර සුරක්ෂිතතාවය ඔවුන්ගේ සංස්කෘතියේ එක් අංගයක් විය. කෘෂිකාර්මික කටයුතු සඳහා භූගත ජලය භාවිතා කිරීම ඔවුන් විසින් කිසි විටෙක භාවිතා නොකළ අතර එය ජල සුරක්ෂිතතාවය සහතික කළේය. වියළි කාලවලදී සියලු කටයුතු සඳහා



ප්‍රයෝජනයට ගැනීමට ප්‍රමාණවත් අක්‍රිය ජල ගබඩාවක් (මඩකළුව) වැව් තුළ දක්නට ලැබුණු අතර ගවයන් සහ වන සතුන් සඳහා එය එකම ජල මූලාශ්‍රය විය. වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂවල පුළුල් විවිධත්වයක් පැවති අතර වියළි කාල සීමාව තුළ වැවේ ජලය තිබීම ඔවුන්ගේ පැවැත්ම සහතික කළේය. සාමකාමී සහ තිරසාර ග්‍රාමීය සමාජයක් ගොඩනැගීමට හේතු වූ සම්පත් සමානව බෙදා ගැනීම සහ හිමිකාරිත්වයේ සාධාරණත්වය ඔවුන්ගේ සංස්කෘතියේ වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණ විය. පරිසර දූෂණය සාකච්ඡාවට තරම් මාතෘකාවක් නොවීය. ඉහත සාකච්ඡා කළ ලක්ෂණ අතුරුදහන් වීමත් සමඟ සමස්ත පද්ධතියම සමාජීය, භෞතික හා ආර්ථික වශයෙන් පිරිහීමට ලක් වූ අතර ඒවා සමඟ ව්‍යසනවලට ගොදුරු වීමේ අවදානමද වැඩි විය.

බටහිර රටවල දියුණු වූ කෘෂිකාර්මික තාක්ෂණය බොහෝ පර්යන්ත රටවලට ගෙන ඒම ඔවුන්ගේ සියවස් ගණනක් පැරණි කෘෂිකාර්මික ක්‍රම සහ තිරසර බව සහ පාරිසරික සංහිඳියාව ඇති කළ ප්‍රඥාව අනතුරට ලක් කළ බව බොහෝ දෙනා තේරුම් ගෙන ඇත. ජෛව හායනය, පාංශු සාරවත් බව ක්ෂය වීම, පළිබෝධ සහ රෝග ආක්‍රමණය, ආහාර විෂ වීම, ආහාර ස්වෛරීභාවය බිඳ වැටීම වැනි ව්‍යසනකාරී තත්ත්වයන් රැසක් එහි ප්‍රතිඵල වී ඇත. මේ වන විට ජාත්‍යන්තර සංවිධාන කිහිපයක් විසින් මෙම වැළලී යන

දැනුම අධ්‍යයනය කර පවතින අතර එම දැනුම පරිසර, ආර්ථික සහ සමාජ විද්‍යාත්මක තත්ත්වයන් යටතේ නැවත යථා තත්ත්වයට පත් කිරීමට උත්සාහ දරති. අප ඉතිහාසයේ දන්නා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ විවිධ වී භූදර්ශක 2000 කට වඩා වගා කර ඇති බව පැහැදිලිය. මෙම ප්‍රභේද ප්‍රදේශය, කාර්යය, පස, ජලය සහ දේශගුණික ආතතීන් සහ ඒවායේ අද්විතීය රසය සහ සුවඳ අනුව වෙනස් විය. උදාහරණයක් ලෙස, කිරි දෙන මව්වරුන් සඳහා හීනටි සහල් වගා කරන ලදී. තවත් ප්‍රභේදයක් වන කන්නි මුරුංගා වගා කළේ කුඹුරු වැඩට යන පිරිමින් සඳහා ය. සුවඳැල් එහි අසාමාන්‍ය සුවඳ සඳහා වගා කරන ලදී. මධ්‍යහ්නයෙන් පසු ආහාර නොගත් භික්ෂූන් වහන්සේලාට මාස හයක් අටක් තිස්සේ වගා කරන ලද විශේෂ ප්‍රෝටීන් ප්‍රමාණයෙන් යුත් ''මාවී'' නම් විශේෂයක් ලබා දෙන ලදී. විවිධ ප්‍රභේද දවසේ විවිධ ආහාර සඳහා, පිළියෙලකිරීම්, රෝගීන්, වැඩිහිටියන්, ළදරුවන් ආදිය සඳහා වෙනස් විය. එසේම ලවණතාව (පොක්කලි වී), ගංවතුර සහ නියඟය සඳහා ඔරොත්තු දෙන ප්‍රභේද ද විය. අරමුණ අනුව සහ විවිධ පරිසර තත්ත්වයන් මත අභිජනන අරමුණු සඳහා ඒවා විමර්ශනය කිරීම, වර්ගීකරණය කිරීම සහ භාවිතා කිරීම අවශ්‍ය වේ.

### ඉදිරි මග

❖ කිසියම් සංසිද්ධියක් අර්ථකථනය කිරීමට නොහැකි වීම එය මිථ්‍යාවක් බව අදහස් නොවේ. සාම්ප්‍රදායික ප්‍රජාවන්හි අනුගමනය කරන බොහෝ භාවිතයන් ආගමික හා අධ්‍යාත්මික විශ්වාසයන් සහ විශ්වීය බලපෑම් සමඟ මිශ්‍ර වී ඇත. මේ අනුව, එක් එක් සංරචකයේ බලපෑම් වෙන වෙනම සොයනවා වෙනුවට 'සාකල්‍ය

ආවරණ ප්‍රවේශයක්' භාවිතා කිරීම නුවණට හුරුය. උදාහරණයක් ලෙස, නව කැකුලම යනු වර්තමාන පරිසරය සලකා බැලීමේදී සම්ප්‍රදායික කැකුලම වැඩිදියුණු කිරීමකි. ඇතැම් සංරචකවල නොදන්නා සහ නොපෙනෙන බලපෑම කුමක් වුවත්, කැකුලම සම්පූර්ණ පැකේජය සඳහා ශූන්‍ය කල්පිතය පරීක්ෂා කළ හැකිය.

❖ දේශීය දැනුම සැබෑ භාවිතා කරන්නන් සමඟ සහ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන සැබෑ පරිසරය තුළ අත්හදා බැලීම් කිරීමට පර්යේෂණ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

❖ පෙර අත්දැකීම් හේතුවෙන් විමර්ශනය පක්ෂග්‍රාහී නොවිය යුතුය. විමර්ශකයා සහ වෘත්තිකයා සමීප ඇසුරක් තිබිය යුතු නමුත් අතීත කථාවලින් අර්ථකථනවලට සහාය නොවිය යුතුය.

❖ විශ්ලේෂණයේ දී භෞතික හා අධ්‍යාත්මික සංරචකවල බලපෑම් වෙන් කිරීමේ හැකියාවක් තිබිය හැක, කෙසේ වෙතත්, මෙම සාකල්‍ය ආවරණය අත්හදා බැලීමේදී එය සිදු නොකළ යුතුය. සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ බොහෝ නොදන්නා සංඝටක, නිශ්චිත යෙදුම් ක්‍රමය සහ පසු යෙදුම් භාවිතයන් ඇති බැවින් දන්නා අමුද්‍රව්‍ය විශ්ලේෂණය කිරීමෙන් පමණක් බටහිර හා සාම්ප්‍රදායික ඖෂධවල බලපෑම සැසඳිය නොහැක.

❖ වර්තමාන කෘෂිකර්මාන්තය සඳහා විකල්පයක් ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ගික යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමේදී, කෘෂිකාර්මික අංශයේ තිරසර බව සහතික කිරීම සඳහා ගැඹුරින් මුල් බැසගත් සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් සහ කාලය මගින් පරීක්ෂා කරන ලද කෘෂිකාර්මික භාවිතයන් පිළිබඳ අවබෝධය ලබා ගත යුතුය. නවීන කෘෂිකර්මාන්තය නිසා ගොවීන්ගේ යැපුම් මානසිකත්වය විකාශනය වූ අතර කලින් කළට කෘෂිකර්මාන්තය සමඟ කටයුතු කරන රජයේ ප්‍රතිපත්ති ක්‍රමයෙන් ඉවත් කළ යුත්තේ ආත්ම විශ්වාසය, ආත්ම අභිප්‍රේරණය සහ සවිබල ගැන්වීමෙනි.

❖ කෘෂිකර්මය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් රටේ සාම්ප්‍රදායික බෝග සහ ප්‍රභේද, සම්පත් සංරක්ෂණ පිළිවෙත්, ඖෂධ පැළෑටි, ගෘහ කර්මාන්ත සහ කෘෂිකාර්මික උරුමයන් සංරක්ෂණය හා ප්‍රයෝජනයට ගැනීම සහතික කරන කෘෂිකර්මාන්තයේ පාරම්පරික දැනුම භාවිතය අවධාරණය කළ යුතුය.



❖ කෘෂිකාර්මික පර්යේෂණ න්‍යාය පත්‍රය බෝග පාදකයේ සිට සම්පත් ඵලදායිතාව පදනම් කර ගනිමින් ප්‍රතිනිර්මාණය කිරීම තිරසාර බව ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. දේශීය පරිභෝජනයට මෙන්ම විදේශීය වෙළෙඳපොළට ආවේණික පලතුරු, එළවළු සහ ඖෂධ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම පර්යේෂණ තුළින් ආරම්භ කළ හැක. වර්තමානයේ ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ දැනුම විසිරී ඇති අතර විවිධ ආයතනවල රඳවා ගෙන පවතී. වැඩිදුර අධ්‍යයනයන් අවශ්‍ය වන හිදැස් හඳුනාගෙන ඒවා ජාලගත කිරීම මගින් සංවිධානය කිරීම අවශ්‍ය වේ.

❖ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වත්මන් තත්ත්වය යටතේ දේශීය තාක්ෂණයේ පුනර්ජීවනය සඳහා ප්‍රතිපත්ති විධානවල සිට බිම් මට්ටමේ ක්‍රියාකාරකම් දක්වා උපාය මාර්ගික යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ. අපගේ දේශීය කෘෂිකාර්මික උරුමයේ ප්‍රෞඪත්වය ගොඩනැගීමට අප ගන්නා දැවැන්ත උත්සාහයන් තුළින් අපේ ජාතියේ ආකල්පමය වෙනසක් මෙයට ඇතුළත් විය හැකිය. අදාළ ප්‍රතිපත්ති විධාන යටතේ දේශීය දැනුම සඳහා ජාතික ආයතනයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කළ යුතුය. දේශීය දැනුම පිළිබඳ ආයතන ස්ථාපනය කිරීමට දරන ලද අතීත උත්සාහයන් කිහිපයක් වාර්තා ගතව ඇත. නමුත් දැනට එවැනි එකම ආයතනයක් හෝ සක්‍රිය තත්වයෙන් ඇත්තේ නැත. එවැනි ආයතන දැනටමත් බොහෝ රටවල ස්ථාපිත කර ඇති අතර සමහර ඒවා අදටත් සාර්ථකව ක්‍රියාත්මක වේ.



**ආචාර්ය පී. බී. ධර්මසේන**
බාහිර කථිකාචාර්ය
රජරට විශ්වවිද්‍යාලය
dharmasenapb@ymail.com

# සම්ප්‍රදායික කාලගුණ පුරෝකථන පසුබිමේ පවත්නා විද්‍යාව

ඩිලානි හිරිමුතුගොඩගේ



සම්ප්‍රදායික දැනුම යනු යම් කිසිවක් පිළිබඳව සහ අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් මිනිසුන් තුළ පවත්නා දැනුවත් බව සහ වටහා ගැනිම ලෙස නිර්වචනය කළ හැකිය. එම දැනුම මුඛමාර්ගයෙන් (කට වචනයෙන්) එක් පරම්පරාවකින් ඊළග පරම්පරාවට පැතිරයාම හෝ එක් විශේෂිත වන ජනකණ්ඩායමක් තුළ පවතින්නාවූ හෝ දැනුමකි. දේශීය දැනුම යන පාඨයද 'සම්ප්‍රදායික දැනුම' පාඨය යන තේරුම ලබාදීම සඳහා යොදාගැනේ. කෘෂිකර්මය, කෘෂිවනවගාව, සම්ප්‍රදායික වෛද්‍යක්‍රම, ජෛවවිවිධත්වය සංරක්ෂණය, ස්වභාවික ව්‍යසන සඳහා සූදානම්වීම සහ ප්‍රතිචාර දැක්විම ආදී විෂය ක්ෂේත්‍ර තුළ සම්ප්‍රදායික දැනුම බහුලව පිළිගැනීමට ලක්ව ඇත. එය නිරීක්ෂණය කිරීම සහා අර්ථ දැක්වීම තුළින් දේශගුණවිද්‍යාවට ද දායක වෙයි.

කෘෂිකර්මයේදී ගොවීන් සතු සම්ප්‍රදායික දැනුම විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගත හැක. උදාහරණ ලෙස කාලගුණ රටාවන් පිළිබඳව පුරෝකථන පලකිරීමට, විවිධ පරිසරමය තත්වයන්ට (පසේ ස්වභාවය, වැසි ලැබිම, උෂ්ණත්වය, මුහුදු මට්ටමේ සිට පවතින උස) ශාක සහ බෝග සංවර්ධනය සහ අනුහුරුවීම යනාදිය එම ප්‍රයෝජන අතර පවතියි. වී වගාව අතීතයේ සිට පැවත එන්නක් බැවින් වී වගාවේ කෘෂිකාර්මික කාර්යයන් සඳහා ගොවිහු දැනටත් සම්ප්‍රදායික ක්‍රම භාවිතා කරමින් දිගින් දිගටම ගොවිතැන්හි නිරතවීම හේතුකොට, කාලගුණ රටාවන් පිළිබඳ පුරෝකථන හෙවත් අනාවැකි පළකිරිම සහ වගා ක්‍රම සුදුසු පරිදි අනුහුරු කර ගැනිම විශේෂ කොටගැනීම ක්ෂෙත්‍ර කිහිපයකදිම දැකිය හැකිය. ඒ අනුව සම්ප්‍රදායික දැනුම භාවිතය පිළිබඳ විශේෂඥතාවයන් ඔවුහු හිමිකරගෙන ඇත.

කෘෂිකර්මය ශ්‍රී ලංකා ආර්ථිකයේ වැදගත් අංශයකි. රටෙහි දළ දේශීය නිෂ්පාදනයේ (ද. දේ. නි. ) 8% කට පමණ එය දායක වෙයි. එයට අමතරව සමස්ත ශ්‍රමික බලකායෙන් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් කෘෂිකර්මයෙහි නිරතව සිටිති. දළ දේශිය නිෂ්පාදනයෙහිලා කෘෂි ක්ෂේත්‍රයේ වැදගත්කම ක්‍රමයෙන් පහළ යමින් තිබුණද ආර්ථිකයේ කැපීපෙනෙන කාර්යයන් ඉටුකිරිමට එය තවදුරටත් සමත්ව ඇත. මෙයට මූලික හේතුවන්නේ මෙරට ජනගහනයෙන් සියයට 75 ක් අදටත් ග්‍රාමීයව ජීවත් වන අය ලෙසට වර්ගීකරණය කර ඇති බැවින් සහ






**1 රූපය : සම්ප්‍රදායික කාලගුණ පුරෝකථන දැක්වීමේ ශිල්පක්‍රම**
**ආශ්‍රිතය : ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යනය ආයතනයේ අධ්‍යයනයක ප්‍රතිඵල ඇසුරෙන් සැකසින.**

ඔවුන් වැඩිදෙනෙක් සිය ජීවිකාව සඳහා කෘෂිකාර්මික කටයුතු වල යෙදී සිටින බැවිනුත්ය. තවදුරටත් සඳහන් කළහොත් ශ්‍රී ලංකාවේ වගාකරන ප්‍රධාන බෝගය වී වන අතරම වගාව සඳහා යොදාගතහැකි භූමි ප්‍රමාණයේ 34%ක් පමණම වී වගාව සඳහා යොදා ගෙන තිබේ. ඒ සඳහා ගොවීන් මිලියන 1.8 ක් පමණ මේ ක්ෂේත්‍රයේ නියැලී සිටිති.

ශ්‍රී ලංකාව තුළ කන්න දෙකකට වී වගාව සිදු කෙරේ. ඒ යල කන්නය, (අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වාත්) සහ මහා කන්නය, (ඔක්තෝම්බර් සිට මාර්තු දක්වාත්) වශයෙනි. තෙත් කලාපයේ වී වගාව සිදුකරනුයේ වැසිජලය ආධාරයෙන් වන අතර වියළි කලාපයේ වැව් මාර්ගික ජලය ආධාරයෙන් වී වගාව සිදු කෙරේ. වැස්ස, සුළඟ, ආර්ද්‍රතාවය යනාදිය පිළිබඳ කාලගුණ පුරෝකථන පළ කිරීම, වාරිකර්මාන්තයේදී වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර මෙම ක්ෂේත්‍රයේ නිෂ්පාදකතාව කෙරෙහි ඉතා වැදගත් බලපෑමක් ඇති කිරීමටද සමත්ය. එහෙයින් කාලගුණ අනාවැකි පළකිරීමේ දී ගොවීන් තුළ පවත්නා සම්ප්‍රදායික විද්‍යාත්මක දැනුම කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සාර්ථකත්වය සඳහා බෙහෙවින් වැදගත්ය.
මෙම ලිපිය සංවිධානය කිරීමේදී දේශගුණය සහ කාලගුණ අනාවැකි පළකිරීමේදී භාවිත වන සම්ප්‍රදායික දැනුම, කාලගුණ අනාවැකි පළකිරීමේදී සම්ප්‍රදායික දැනුම භාවිතා කිරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ සහ තෝරාගත් තවත් රටවල් කිහිපයක උදාහරණ සම්ප්‍රදායික සහ නූතන කාලගුණ පුරෝකතන පළකිරීමේ ක්‍රියාවලි අතර පවත්නා සබැඳියාව, සම්ප්‍රදායිකව කාලගුණ අනාවැකි පළකිරීමේදී එල්ලවන අභියෝග සහ මෙම ක්ෂේත්‍රයේ අනාගතය, පිළිබඳව අවධානය යොමු කර ඇත.

## කාලගුණ පුරෝකථන පිළිබඳව පවත්නා සම්ප්‍රදායික දැනුම

ශ්‍රී ලංකාවේ බොහෝ ගොවීහු "විශේෂයෙන්ම වී ගොවිතැනෙහි නියැලෙන ගොවීහු" ඍතුමය විචල්‍යයන් හඳුනා ගැනීමට සහ කාලගුණ රටා අනාවැකි පළකිරීමට සිය මුතුන්මිත්තන්ගෙන් උරුම වූ ශිල්ප සහ ක්‍රම විධි භාවිත කරති. යථාර්ථය නම් පෙර සඳහන් කළ, යල සහ මහ කන්න බිහිවූයේ එවැනි දැනුම සහ නිරීක්ෂණ පදනම් කර ගෙන බවය. ගොවීන්, වගාකිරීම මෙම අනාවැකි සහ රටා පදනම්ව ආරම්භ කරන අතර බොහෝ අවස්ථාවලදී ඒ පිළිවෙත් සාර්ථකය. ඔවුහු සිය කෘෂිකාර්මික තීරණ වලට එළඹීමේදී සතුන්ගේ හැසිරීම්, සමහර ගස් වල මල් පිපීම, (බොහෝ විට දේශීය ශාක), විවිධ කෘමි සතුන් දක්නට ලැබීම ආදී ස්වභාවධර්මයාගේ ඇතිවන වෙනස්කම් පදනම් කර ගනු ලබයි. ඇතැම් අවස්ථා වලදී මෙම චර්යාවන් සහ තීරණ ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වීමක්ද දක්නට ලැබිණි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සිය හවුල්කරුවන්ගේ සහය ඇතිව සිදුකරන ලද සමෝධානික දේශගුණ ''කළමනාකරණ ක්‍රමය'' පිළිබඳ අධ්‍යයනය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයකින් සම්බන්ධකරගත් නවසියයක් පමණ වූ ගොවීන්ගෙන් හෙළිදරව්වූයේ කෘෂිකර්මය පිළිබඳ තීරණ ගැනීමේදි කාලගුණ පුරෝකථන හෙවත් අනාවැකි පළකිරීම පිළිබඳව සම්ප්‍රදායික දැනුම අදටත් භාවිත වන බවය. 1 වන රූප සටහනේ දැක්වෙන පරිදි අධ්‍යයනය සඳහා සාකච්ඡාවට ලක්කළ ගොවීන් අතරින් ඉතා ඉහළ ප්‍රතිශතයක් සිය කාලගුණ අනාවැකි නිගමනය සඳහා යොදාගනු ලබන්නේ සම්ප්‍රදායික දැනුමය. මෙහිදි වඩාත් වැදගත් වනුයේ සම්ප්‍රදායික දැනුම භාවිතා කරන ගොවීන් සම්ප්‍රදායික හා නූතන ක්‍රම මගින් පළවන කාලගුණ අනාවැකි එකිනෙක හා සමාන බව දැක්වීමය. මෙම ක්‍රම දෙකෙහි අනාවැකි අතර පවත්නා එකිනෙකට අනුකූලබව ගොවීන් අතරින් 60% ක්ම පිළිගනු ලැබූහ.

වගාකිරීමේ ක්‍රියාවලිය තුළ ගොවීන්ගේ පුරෝකථනයන් විවිධ අවස්ථාවලදී දැකිය හැක. වැසි වැටීම ඇතිවීමක් සමග එහි තීව්‍රතාවය, වැසි වැටීම කොපමණ කාලයක් පවතිද, සුළං හමන වේගය සහ සුළං හමන දිශාව"උෂ්ණත්වය ආර්ද්‍රතාවය යනාදිය සම්බන්ධ පුරෝකථනයට ඇතුළත්ය. 2 වන රූප සටහන මගින් සම්ප්‍රදායික කාලගුණ පුරෝකථන විධිමත් පුරෝකථන සමඟ කොතෙක් දුරට අනුකූලවේදැයි යන්න පැහැදිලි කිරීමක් සිදුකරයි.

ගොවීන්ගේ පුරෝකථනයන්හි පදනම වනුයේ වසර ගනණාවක් මුළුල්ලේ ඔවුන් ලද අත්දැකීම් සහ ස්වභාවික

පරිසරය සමග ඔවුන් පවත්වා ගෙන ගිය සම්බන්ධතා සහ ගැටීම අනුවය. ඔවුහු අහසේ පායන තරු රටා, සත්ව චර්යා, උරගයන් දක්නට ලැබීම හා නොලැබීම, කුරුළු විශේෂයන්ගේ සංක්‍රමණය, වළාකුළු ආවරණය,ග ස්වල මල් පිපීම යනාදිය නිරීක්ෂණය කරති. මෙම අත්දැකීම් සමහරක සවිස්තරාත්මක විස්තරයක් පහත දැක්වේ.

නම් කොහොඹ ගස්වල කුරුල්ලන් කූඩු තනන්නේ නම් ලඟ ලඟම වැසි කාලය පැමිණෙන බව ගොවීන්ගේ පිළිගැනීමය. එමෙන්ම කුරුල්ලන් රංචු ගැසී එකම දිශාවකට පියාසර කරන්නේ නම් එයද වැසි ලග බව අඟවන බව ඔවුන්ගේ පුරෝකථනයයි. එමෙන්ම සමහර කෘමින්ගේ මතුවීම ද උපයෝගි කර ගෙන කාලගුණ වෙනස්වීම් පිළිබඳ පුරෝකථන සිදුකිරීමට ගොවීහු සමත්ය.

සාමාන්‍යයෙන් පලු ගස්වල මල් හට ගන්නේ මැයි මාසයේදීය. එමෙන්ම අඹ ගස්වල ඵලදාව සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා යන තරමට වඩා ඉහළ නම් කෘෂිකර්මය සඳහා ප්‍රමාණවත් වැස්සක් ලැබෙන බවත් ගොවීන්ට යල සහ මහ යන කන්න දෙකම වැඩ කිරීමට හැකි වන බවත් විශ්වාසයයි.

### වළාකුළු ආවරණය සහ වළාකුළු වර්ණය

වළාකුළු රටාවන් සහ වළාකුළු පැහැය නිරීක්ෂණය කිරීම මගින්ද ශ්‍රී ලංකාවේ ගොවීහු කාලගුණ පුරෝකථන සිදු කරති. සාමාන්‍යයෙන් අගෝස්තු මාසයේදි දැකිය හැකි අදුරු කැටිගැසුනු වළාකුළු මහ වැසි පිළිබඳ අනාවැකි පළ කරයි. එයට අමතරව සඳවටා අඳුරු වළාකුළු පැවතිම ඉදිරි වැසි වැටිමක් හඟවන අතර දේදුනු පෑයිමද අනාගත වැසි ලැබෙන බවට ඉගියකි. නැගෙනහිර අහස රතුපැහැති වළාකුළුවලින් බර වුවහොත් එය මහ වැසි ලැබීමක් අඟවන අතර යහපත් මහ කන්නයක් පිළිබඳව බලාපොරොත්තු ගොවීන් තුළ ඇති කිරීමට සමත් වෙයි.



### ශ්‍රී ලංකාවේ ගොවීන් විසින් භාවිත කරනු ලබන සම්ප්‍රදායික දැනුම පිළිබඳ උදාහරණ කිහිපයක්

### සත්ව චර්යා ( සතුන්ගේ හැසිරීම්)

මෙම පුරෝකථන ප්‍රධාන වශයෙන් පදනම්වනුයේ කුරුල්ලන්ගේ හැසිරීම් සහ කෘමින්ගේ මතුවීම මතය. උකුස්සන්, කපුටන්, බකමූණන්, ආදී කුරුල්ලන්ගේ හැසිරීම් වී ගොවීන් හට අවශ්‍ය පුරෝකථනයන් සපයයි. උකුස්සන් ඉහළ අහසේ පියාඹයි නම් කූඩුවක් තුළ තරුණ කපුටන් දෙදෙනෙකුට වඩා සිටි නම් වියළි කාලයේ බකමූණන් හඬ නගන්නේ

නොවැම්බර් මාසයේදී මෙරු ඉගිලීම ඇතිවීමක් සමගම මහ කන්නය සඳහා වැසි ලැබීම ආරම්භවන බවට අනාවැකි පළකෙරෙයි. එසේම රබර් ගස්වල වේයන් දක්නට ලැබීම අනාගත වැසි කාලයක් පිළිබඳ අනාවැකි සපයන බව ඔවුන්ගේ විශ්වාසය වී පවතියි.

### ගස් වල මල් පිපීම

සමහර ගස්වල විශේෂයෙන්ම මොර සහ දිවුල් වැනි දේශීය ගස්වල පොහොට්ටු ඇතිවීම සහ මල් පිපීම ද ගොවීන් හට කාලගුණ හා දේශගුණ වෙනස් වීම් පිළිබඳ අනාවැකී පළකිරීමට අවස්ථාව සලසයි. ලංකාවේ පලු ගස් ඵල වලින් පිරියාම, මහා වැසි වැටීම අඟවයි.

### වැසි වැටීම සහ සුළං

මෙම නිරීක්ෂණවලට අමතරව ඍතුමය විචල්‍යයන් හඳුනාගැනීම සඳහා නිශ්චිත පුරෝකථන සැපයීම සඳහා තවත් ක්‍රමයක්ද පවතියි. සමහර දිස්ත්‍රික්ක වල ගොවීහු ඔක්තෝම්බර් 10-15 දිනයන් අතර තුර වැසි ලැබෙන බවට විශ්වාස කරති. ඔවුන් එය ''අක්වැස්ස'' ලෙස හඳුන්වති. එය ඔවුන්ට යල සහ මහ කන්න දෙකම වගාව සාර්ථකව සිදු කළ හැකි බවට විශ්වාසයක් ඇති කරයි . එමෙන්ම ගොවීහු ඔවුන්ගේ ආගමික හා ජ්‍යොතිෂමය දින දර්ශනයද (පංචාංග ලිතද) භාවිත කරමින් පුරෝකථන සිදුකිරීම සහ වගා කළ යුතු බෝග වර්ග තෝරා ගනිති. සමහර ප්‍රදේශවල, මුහුදු ආසන්නයේ වෙසෙන ගොවීහු තීරණ ගැනීමේදි

මුහුදු සුළං හමන දිශාවද සැළකිල්ලට ගනිති. එසේම තීරණ ගැනීමට ප්‍රථම සාගරයේ ඇතිවන දිය සුළි පිළිබඳව ඔවුහු උනන්දු වෙති. වැසි සමය පිළිබද පුරෝකථන පළකිරීමට පළමුව ගොවීහු සුළං වේගය සහ සුළං හමන දිශාව පිළිබඳව විමසිලිමත් වේ. ඍතුමය විචල්‍යයන් නිරීක්ෂණය භාවිතයෙන් පුරෝකථන පළකිරීමට ගොවීහු උපයෝගි කරගන්නා බොහෝ විට එක ලෙසටම වෙනස්නොවී පවතින පරිසරමය වෙනස්කම් දැක්විය හැකිය. ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වන ශ්‍රී ලංකා ආයතනයට අනුව ලොව පුරා ගොවීහුද මෙපරිදිව කාලගුණ පුරෝකථන සඳහා සම්ප්‍රදායික දැනුම භාවිත කරති. එවැනි උදාහරණ කිහිපයක් දෙවැනි රූපය තුළින් ගෙන හැර දැක්වයි.




**2 රූපය : සම්ප්‍රදායික සහ විද්‍යාත්මක කාලගුණ පුරෝකථන අතර පවත්නා අනුකූලතාවය**
**ආශ්‍රිතය : ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයනය ආයතනයේ තොරතුරු ඇසුරෙනි.**

වසර දහස් ගණනක් තිස්සේ ලොව පුරා රටවල් රාශියක ගොවිහු සිය ඍතුමය (කන්නමය) සහ අන්තර්වාර්ෂික ක්‍රියාකාරකම් උදෙසා කාලගුණ පුරෝකථන යොදා ගැනීමේදී සම්ප්‍රදායික දැනුමෙහි නිරීක්ෂණ සහ අර්ථකථන භාවිතා කරති. ඒ සඳහා තෝරාගත් උදාහරණ කිහිපයක් මෙසේ දැක්විය හැක.

ඉන්දියාවේ ගොවීහු වසර ගණනාවක් සඳහා බෝග සහ වාරිමාර්ග චක්‍ර පිළිබඳ තිරණය ගැනීම සඳහා කාලගුණ සහ දේශගුණ රටා අවබෝධ කරගැනීම සඳහා සම්ප්‍රදායික දැනුම භාවිත කර ඇත. මෙවැනි නිරීක්ෂණ පදනම්ව වැසි වැටීම පිළිබඳ පුරෝකථනයන් උදෙසා විවිධාකාරයේ සම්ප්‍රදායික දැනුම භාවිත කර ඇත. උදාහරණ ලෙස සුළං සංචලන, විදුලිකෙටීම, සත්ව චර්යා, කුරුළු සංචලන, සඳ වටා ඇතිවන සඳමඬල සහ මුදු, අමාවක දිනයේ සිට 3 වන දිනයේ සිට 5 වන දිනය දක්වා සඳේ හැඩය සහ පවතින ස්ථානය ආදිය කරුණු උදාහරණ ලෙස දැක්විය හැකිය. අප්‍රිකානු රටවල ගොවීහු පලතුරු සහ අනෙකුත් දේශීය ශාක වල පොහොට්ටු සහ මල් ඇතිවීම පදනම් කරගෙන කාලගුණ අනාවැකි සහ දේශගුණ පුරෝකථනයන් සිදුකරති. බටහිර කෙන්යාවේ පදිංචිකරුවන් විසින් කුරුල්ලන්, ගෙම්බන්, සහ සුදු පැහැති කුහුඹුවන් ආශ්‍රිතයෙන් ග්‍රීෂ්ම ඍතුවේ එළඹීම, වැසි වැටීම මෙන්ම උෂ්ණත්වය පිළිබඳ පුරෝකථනයන් සිදු කරති. පේරු රටෙහි පුනෝ කලාපයේ ජනතාව බෝග සිටුවීම සහ අස්වැන්න නෙළීම ආදී කෘෂිකාර්මික තිරණ



ගැනීමේදී පරිසරය සහ වන සත්ව ජීවිත (එනම් වැහි වැටීමේ නිරන්තරය, සමහර ශාක වල මල් පිපීම, සමහර සතුන් දක්නට ලැබීම, සතුන්ගේ සංසරණ ක්‍රියා සිදුවීම, පළිබෝධයන්ගේ ගහනය ඉහළ යාම, ආදිය) පිළිබඳව පවත්නා සම්ප්‍රදායික දැනුම යොදා ගනිති. බොලීවියානු ගොවීහු සුළං, හිම සහ වළාකුළු, විමර්ශණය කිරීම තුළින් වගා කරන බෝග විශේෂ නිගමනය කිරීම සහ ඒවා වගා කළ යුතු කාලය සහ ප්‍රදේශය නිරීක්ෂණය කරති. සම්ප්‍රදායික කෘෂිකාර්මික වත්පිළිවෙත් හැඩගැන්වීමේදි චන්ද්‍රයා පදනම්කරගත් දින දර්ශන භාවිතයද සිදු වෙයි. තුවාලු දූපත් හී ගොවීහු  කාලගුණය පිළිබඳ අර්ථකථනයට සම්ප්‍රදායික ඍතුමය දින දර්ශනය භාවිතා කරති. තුවාලු දූපත්හී අපේක්ෂිත ආන්තික කාලගුණ සිදුවීම් ආශ්‍රිත අනාවැකි පළකිරීම් සඳහා පුළුල් පරාසයක සම්ප්‍රදායික ක්‍රම භාවිතා කිරීම. මෙම ශිල්ප ක්‍රම යැපෙනුයේ මුහුදු සහ කලපු (උදා: ප්‍රමාණය තරංග වල ශක්තිය සහ හඬ, ජලයේ වර්ණය, ගන්ධය, සහ වෙරළ මත තැන්පත් කරන මුහුදු පැළෑටි ප්‍රමාණය) අහස (උදා : වළාකුළුවල වර්ගය සහ පැහැය, සඳ දර්ශනය වන ආකාරය) සහ සුළං (උදා : සුළං හමන මූලික දිශාව සහ වේගය) යනාදිය නිරීක්ෂණය කිරීම මතය.

## සම්ප්‍රදායික දැනුම සහ නවීන දැනුම අතර පවත්නා සබැඳියාව

සංවර්ධන ක්‍රියාවලියේදි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සමගම පරිසර වෙනස්කම් කිහිපයක්ද සිදුව ඇත. පරිසර සාධක අතරින් බොහොමයක් වෙනස් වීමට ලක්ව ඇති නිසාත් ඔවුන්ගේ මුතුන්මිත්තන් භාවිතා කළ සම්ප්‍රදායික නිර්ණායක වර්තමානයේදී ලබාගත නොහැකි නිසාත් ගොවීන්ට සමහර විට ඔවුන්ගේ සම්ප්‍රදායික දැනුම මත පමණක් යැපීමට වර්තමානයේදි අවස්ථාව නොතිබිය හැකිය. එහෙයින් සමහර ගොවීන් "අප පෙරකළ පරිදිම කාලගුණ පුරෝකථන දැන් සිදු කළ නොහැකි" යනුවෙන් පවසති. එහෙයින් මෑතකදි ඇති වූ පරිසරයේ වෙනස්කම් හේතුකොට සම්ප්‍රදායික පුරෝකථනයන්හි විශ්වාසයනීයත්වය අඩු වී ගොස් ඇත. එසේනම් බොහෝ අවස්ථාවලදී ගොවීහු තම සම්ප්‍රදායික දැනුමත් ශ්‍රී ලංකාවේ කාලගුණ දෙපාර්තමේන්තුව පළකරන කාලගුණ හා දේශගුණ අනාවැකි යන දෙකම සිය අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගනිති. විද්‍යාත්මක අනාවැකි තුළින් කාලගුණ විද්‍යාත්මක නිර්ණායක පදනම්ව මහපරිමාණ පුරෝකථන විශාල ප්‍රදේශයකට බලපාන පරිදි ලබාදීමක් සිදුකෙරේ. එසේ නමුත් සම්ප්‍රදායික පුරෝකථන කිසියම් ප්‍රදේශයකට, ගමකට හෝ ගොවීන් කණ්ඩායමකට පමණක් සැපයෙන්නෙක් නම් මෙහි පෙර සඳහන් කළ පර්යේෂණ මගින් ද හඳුනාගෙන ඇතිපරිදි දේශගුණ වෙනස්කම් පිළිබඳව පුරෝකථන සිදුකිරීමේදි ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම සහ විද්‍යාත්මක පදනමක් සහිත දේශගුණ හා කාලගුණ අනාවැකි සමග හවුල්ව භාවිත කිරීමේ ඇති යෝග්‍යතාවයයි. විශ්වාසනීත්වයෙන් ඉහළ ප්‍රතිඵල ලබාදීමටත් මෙම දේශගුණ හෝ පරිසරමය නිරීක්ෂණ දේශගුණ විද්‍යාව සමග සුසංගත වීමක් සිදුවනු ඇත. අවසාන වශයෙන් කිවයුත්තේ විශාල පරිමාණයෙන් කාලගුණ අනාවැකි පළ කිරීම වෙනුවට ප්‍රාදේශීය මට්ටමෙන් කාලගුණ අනාවැකි පළකිරීම තුළින් වඩා නිරවද්‍ය පුරෝකථන සිදුකිරීමට පමණක් නොව ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම ප්‍රශස්ත ලෙස භාවිතයට ද ඉඩ සලසනු ඇති බවයි.

## ඉදිරි මග

මෙහි පෙර සඳහන් කළ කරුණු සලකා බලන විට ගොවීන්ගේ සම්ප්‍රදායික කාලගුණ අනාවැකි පළකිරීමේ ක්‍රියාවලිය අද්විතීය වූවකි. එසේම එය තැනින් තැනට වෙනස් වන්නකි. එසේ වුවද මෑතකදී සිදු කල යටිතල පහසුකම් සංවර්ධනය නිසා පරිසරයේ ඇති වූ වෙනස්කම් හේතුවෙන් සාම්පදායික නිරීක්ෂණ මත පදනම්ව දේශගුණික පුරෝකථන සිදුකිරීම නොකරයි.වර්තමානයේ දේශගුණික පුරෝකථන සිදුකිරිමේදී පාරම්පරික නිරීක්ෂණ පදනම් කර නොගනී.

එබැවින් වර්තමාන සන්දර්භයේදී, සම්ප්‍රදායික කාලගුණ අනාවැකි මතම පමණක් යැපීම පිළිබඳව පක්ෂව සහ විපක්ෂව අදහස් පළ වී ඇත්තේය. එසේ වුව ද විද්‍යාත්මක කාලගුණ පුරෝකථන සන්නිවේදනය කිරීමේදී සම්ප්‍රදායික දැනුම සහ එමගින් සිදුකරන නිරීක්ෂණ පිළිබඳව අවබෝධයකින් යුතුව කටයුතු කිරීම අවශ්‍යය. එබැවින් සම්ප්‍රදායික කාලගුණ අනාවැකි පළකිරීම සහ වර්තමාන විද්‍යාත්මක කාලගුණ පුරෝකථන අතර බැඳීමක් ඇතිකිරීමේ අවශ්‍යතාව පවතියි. එමගින් ගොවි කණ්ඩායම් වලට වඩා සඵලමත් කාලගුණ අනාවැකි ලබා දීමේ අවස්ථාවක් උදා කළ හැකිය. එහෙයින් ඉහළ නිරවද්‍යතාවයක් ඇති විශ්වාසදායි පුරෝකථන ලබා දීමට දේශගුණ හෝ පරිසරමය නිරීක්ෂණ සුසංහිත කිරීම අතිශයින්ම වැදගත්ය. එසේම ඒතුලින් ගොවින්ගේ සම්ප්‍රදායික දැනුම ප්‍රශස්ත ලෙස භාවිතයටද අවස්ථාව උදාවනු ඇත්තේ ය.



**ඩිලානි හිරිමුතුගොඩගේ**
ආර්ථික විද්‍යා පර්යේෂක
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති
අධ්‍යයන ආයතනය

# දේශීය දැනුම සහ පළිබෝධ මර්ධනය

මතුගම සෙනෙවිරුවන්



බෝග වගාවකට පළිබෝධකයන් පැමිණීම සිදු වීම ස්වභාවික සංසිද්ධියකි. පරිසරයේ වෙසෙන විවිධ කෘමීන් සුහුඹුලන් ඇතැම්විට කරල් සහ ගෙඩි වල යුෂ උරා බොති. පත්‍රවලට පැමිණෙන පණුවන් ඩැහැ ගැනීමට පක්ෂීන් වගාවට එති. එවිට කරල් ගොදුරු කර ගැනීමද සිදු වේ. මේ නිසා වගාවේ පළිබෝධ යනු කෘමීන් පමණක් නොවන බව සිහිපත් කළ යුතුය. ගොවීන් විසින් මේ තත්වය වටහා ගන්නා අතර වගාව ආරක්ෂා කර ගැනීමට වගාව ආරම්භයේ සිටම විවිධ කෙම් පහන් භාවිත කිරීමට පෙළඹෙති. කෙම් පහන් යන වචනය පොදුවේ දේශීය දැනුම තුළ පළිබෝධ මර්දනය හැඳින්වීමට යොදා ගැනේ. මේ පළිබෝධ මර්දනයේදී  ක්ෂේම කර්ම නොහොත් කෙම් මෙන්ම භෞතික උපක්‍රම භාවිතා කිරීමට ද ගොවීන් සූදානම්ව සිටිති. පළිබෝධ මර්දනය සඳහා පාරම්පරිකව යොදා ගත් අභිචාර විධි සහ භෞතික ක්‍රියා කාරකම් ලංකාවේ ජෛව විවිධත්වයට අනුව පළාතෙන් පළාතට වෙනස් ව තිබෙන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. මෙම ලිපියේ දී   කෙම්පහන් පිළිබඳ විවිධත්වය සහ එහි විද්‍යාත්මක ප්‍රවේශය පිළිබඳ සාකච්ඡා කෙරේ.

## ක්ෂේම කර්ම (කෙම් ක්‍රම) යෝග්‍යතාවය

වගාවක පළිබෝධයන් ලෙසට කෘමි සතුන් පැමිණෙන කල්හී විවිධ කෙම් ක්‍රම මගින් පාලනය  කිරීමට සිදු වේ. සතුන් ගේ මුඛ බැඳිම මගින් ගොවිපලෙන් පළවා හැරීම එක් ක්‍රමයකි. මෙයට උපයෝගී කර ගන්නේ මැතිරීම් ක්‍රමය. මැතිරීම යනු යම් විධිමත් ආකාරයකට ශබ්ද විද්‍යානුකූලව ගලපා ගත් වචන මාත්‍රා මුදා හැරීමකි. මුඛබැඳීම නම් ක්‍රමය එක්තරා විදියකින් හිංසාකාරී වෙයි. වී වගාවට හානි කරන ගොයම් මැස්සා එහි ඉලක්කයයි. ගොයම් මැස්සෙකු අල්ලා ඇඹුල් දොඩම් ගෙඩියක අඩස්සිකර වක්කඩේ වැළලීම මගින් ද ගොයම් මැස්සන් තිදෙනකු කුඹුරේ තුන් පළකින් අල්ලා "නමෝ කරක්කෙස්වාහං" යනුවෙන් මතුරා  පිටත් කර හැරීම ද කළ විට අනෙක් මැස්සන් ගේ පැමිණීම අඩු වේ යයි විශ්වාසයක් ඇත. මේ සතුනට ආවේණික ගන්ධයක් පවතින අතර උන් අතරට මේ මැස්සන් ගේ පීඩාකාරී සන්නිවේදනය ඇති කිරීම මෙහි උපක්‍රමය වෙයි. වගාවට හානි කරන රිළවෙකු හෝ වඳුරෙකු අල්ලා උගේ ඇඟ පුරා දැලි හෝ සායම් තවරා සුදු තිත් තබා ආපසු උන්ගේම රැළට පිටත් කර හැරීම ද එක් ක්‍රමයෙකි. මෙයින් තම රැළට වෙනත් සතෙකු පැමිණ ඇතැයි බිය කර පලා හැරීම සිදු කිරීම අරමුණක් ලෙස සැලකිය හැක. මේවායේ ද යම් කිසි හිංසනයක් පවතී. සිංහල බෞද්ධ සමාජයක මෙවැනි දේ සිදුවිණිදැයි සැකයක් ඇති වුණ ද ඉතිහාසයේ යුග ගණනාවක් ම විවිධ සංස්කෘතින් ගේ අභාෂයන් අප ලැබූ බවද මෙහිදී මෙනෙහි කළ යුතුය.



සිංහල සංස්කෘතියට සාපේක්ෂ මැතිරීම් ක්‍රම අතර තෙල් මතුරා

බෝමළුවේ පහන් දැල්වීම පෙන්වා දිය හැකිය. බෝමළුව පිරිසිදු කර බෝධි පූජාවකට මෙන් අවශ්‍ය වතාවත් කර සිත එකඟකර ගෙන තම ගොවිපලේ නම සිහිකරමින් පහන් දල්වන අතර



දී එක් පහනකට එළගිතෙල් දමා එම පහනේ තෙලට "නමෝ අත්තතිය භවචාතිය සිධ බුද්ධාතිය ඉටි මිටි ඒස්වාහං" යනුවෙන් එකසිය අට වරක් මතුරමින් බෝධි වන්දනා ගාථාවන් ද කියමින් අවසාන වශයෙන් දෙවියන්ට පින්දී පැමිණීමෙන් ගොයම් මැස්සන් කුඹුරෙන් ඉවත් කිරීමට හැකියයි විශ්වාසයක් පවතී.

කෙම් ක්‍රමයන්හිදී යන්ත්‍ර මන්ත්‍ර යන දෙයාකාරයක් භාවිත වෙයි. මේ තුළින් කියැවෙන පණිවුඩය ගොවි ජනතාව තරම් වටහා ගත් පිරිසක් තවත් නොවීය. ඔවුහු සැම කටයුත්තකදීම මේ ශාස්ත්‍ර භාවිත කළහ. වෙසෙසින්ම යන්ත්‍ර භාවිතයෙහි කෙළ පැමිණි ගොවීහු පුරාතණයේ සිටියහ. යන්ත්‍රය යනු තඹපත්‍රයක සටහන් කරගත් අක්ෂර ක්‍රමවේදයකි. යන්ත්‍රය සකස් කර ගන්නා විට ඒ සඳහා තල්පතක හෝ තඹ පතක හෝ පේ කර ගැනීම කළ යුතුය. පේ කර ගැනීම යනු පිරිසිදු කර ගැනීමයි. නැතිනම් යම් කිල්ලක් හෝ ගුප්ත බලවේගයක ඇති බලපෑම අවම කර ගැනීමට සැලැස්වීමයි. යන්ත්‍රය තල්පතේ හෝ තඹ පතේ හෝ ඇඳ මල් බුලත් තටුවක තබා පේ කර ගැනීම සිරිතයි. "සබ්බ පාපස්ස අකරණං" ගාථාවෙන් මතුරන මේ යන්ත්‍රය ගොවිපලේ එල්ලා තැබීම ජනප්‍රිය ක්‍රමයෙකි.

මෙහි ලියා තිබෙන අක්ෂරයන්හි බලය ඇති වන්නේ කෙලෙසකදැයි විස්තර කරන පුරාණ දැනුම් සම්ප්‍රදාය දැන් අභාවයට ගොසිනි. එහෙත් මැතිරීමේ දී අත්දකින සත්‍යය මෙතනදීද වලංගුය.

ඒ සඳහා අවශ්‍ය වන්නේ යන්ත්‍රය නිවැරදි ආකාරයට ජීවම් කර ගැනීම පමණකි.

ඌරන් වැනි සතුන් ගොවිපළකට පැමිණීම වළක්වනු පිණිස භාවිතා වූ සාර්ථක මන්ත්‍ර ක්‍රමයක් මෙහි සඳහන් කිරීම උචිතයයි සිතමි. එයට භාවිතා කරන්නේ දිවි කදුරු කෝටු අටකි. දිවි කදුරු ශාඛය සර්ප වෙදකමේ දී ඖෂධයක් විලස බහුල ලෙසට යොදා ගනී. දිවි කදුරු ගසකින් මේරීමට පත් වූ කෝටු අටක් කපා ගෙන පළමුවෙන් එය ජීවම් කර ගත යුතුය. ඒ සඳහා මල් බුලත් තටුවක් තනා අවශ්‍ය කළමනා සම්පූර්ණ කොට කදුරු කෝටු අට මල් බුලත් තටුවේ තබා "සබ්බ පාපස්ස අකරණං" යන ගාථාවෙන් දහස් වාරයක් ජීවම් කළ යුතුය. ඉන්පසු දිවි කරණ ඇති දිනයක (මෙම දිනය උදා වන්නේ සඳේ වක්‍ර වීම අනුවයි) ගොවිපළට ගොස් එහි අට කොනේ සිටු විය යුතුය. මෙය කළ යුත්තේ පාන්දර කාලයේදීය.

මෙය එක්තරා විදියක සීමා බැඳීමකි. දිවි කදුරු කෝටු ගැනීම දිවි කරණය යොදා ගැනීම ඌරා නමැති සතා විකර්ෂණය කරන ක්‍රමයකි. දිවිකරණයෙන් වැට බැඳීම තුළින් සතුන් ගෙන් ගොවිපළ ආරක්ෂා කර ගත හැකියයි ගොවින් විශ්වාස කරති.

ගොවිපළකට මීයන් ගෙන් කරදර හානි ඇති විටකදී මීයන් ගොදුරු කර ගන්නා සර්පයින් ගේ පැමිණීම ඇති කර ගත යුතුය. සර්පයින් අතරින් ගැරඬියන් ට වඩා නාගයා බලවත්ය. එහිදී මීයා ගොදුරු කරගන්නා නාගයා ගේ රූපයක් තඹ තහඩුවක ඇඳ එයට ගුරු දිනයක් උදාවෙන අවස්ථාව බලා ගුරු හෝරාවෙන් එම තඹ පත්‍ර හතර ගොවිපලේ වැළලීම සිදු කරති. මෙහිදී ගුරු හෝරාවේ බලය ගැන තේරුම් ගත යුතුය. එය සතුන් ඇති කිරීමට යොදා ගන්නා හෝරාවකි. නාගයා ගෙවිපළට කැන්දන හෝරාවක් ද වේ. නමුත් මෙයින් මිනිසාට හානියක් සිදු නොවේ.

මීයන් කා දමන ගොයම් ගස් එකතු කොට සාදන ලද දරණුවක් මතට උතුරන බත් හැලියක් බෑමෙන් මීයන් ගේ උවදුරු වළකන අපූරු කෙමක් ඇත. එසේම අළුයම හතරට පමණ නැගිට මී ගසක පොතු හතරක් උඩ සිට පහතට ගලවාලෙන වංගෙඩිය යටට දමා තබා රාත්‍රි හතට පමණ එම පොතු කුඹුරට ගොස් තැබීම ද කරති. එසේම වංගොඩියේ කෙටූ වී සහල් කොට කිරිබතක් උයා දෙවියන්ට ඔප්පු කිරීමද කරති. මේ ක්‍රම දෙකේම



පවතින්නේ මීයා පලවා හැරීමට කරන අහිංසක උපක්‍රමයන්ය. මීයන් කපා සපා ගෙනවුත් තබා තිබූ ගොයම් ගස් කැබලි කෙරෙහි පවතින ආශාව මීයන්ගේ වුවද නැති වන්නේ නැත. ඒ මත ගිනි රස්නය ගැවුණු බත් හැලිය දැවටීමෙන් මීයාට යම් සංජායනයක් ඇති විය යුතුය. බත බුද්ධ භෝගයකි. එයට හානි කරන මීයා දෙවියන්ගේ වාහනයකි. මේ කෙම මගින් මීයන් ඉවත් කිරීමට දෙවියන්ට ඉඟියක් ලබා දේ. එසේම මී ගසේ පොතු තබන්නේ වංගෙඩිය යටයි. වංගෙඩියේ නිතරම වී කොටනු ලබයි. එසේත් නැති නම් සහල් පිටි කරයි. මේ කෙම මගින්ද දෙවියන්ට යම් පණිවුඩයක් ලබා දීම අරමුණ කරයි. එය සන්නිවේදනය කරනුයේ මී පොතු මගිනි.



මීයා එළවීමේ භෞතික උපක්‍රමයක්ද ගොවියා සතුය. බළල් වසුරු හා වරා කිරි බළල් වලිගයේ ලොම් හිරියල් සමග අනා නියරවල් මත තැබීම ද හාල් මැස්සන් කුඩු කර ඒවා පොල් කුඩු වල මිශ්‍ර කර පිටි තරමට හීන් වන සේ කොටා ගත් ජාපාල ඇට (විෂ සහිත ඖෂධයක්) මුසු කොට වියළා මීයන් එන මාර්ගයේ තැබීමද කරති. මෑත වකවානුවේ දී ව්‍යාප්ත වූ ගිනිසීරියා මල් සහ වූනා මල් තැබීමද තවත් ක්‍රමයකි.

## පූජා විධි ඇතුළත් කෙම් ක්‍රම

යන්ත්‍ර මන්ත්‍ර නොහොත් අභිචාර විධි වලට අමතරව ලංකාවේ ඇතැම් පළාත් වල පූජා චාරිත්‍ර සමග කෙම් ක්‍රමද අනුගමනය කරති. විවිධ වසංගතයන් ගොයමට වැළඳුන කල්හී විශේෂයෙන්ම මෙම ක්‍රම අනුගමනය කරති. එවැනි අවස්ථාවලදී ගොයම සහිත වෙල් යාය ප්‍රදේශීය දෙවිවරුන්ට භාර දීම කරති. පහන් පැළක් සකස් කර පහන් දල්වා දෙවියන්ට ආරාධනා කර ගොයම භාරදී පසුව අස්වනු කපා පාගා ගැනීමෙන් පසු කිරි උතුරුවා දානය දී භාරය නිදහස් කර ගැනීම සිරිතකි.

ගොඩවෙල්ලන්වැනි පණු උවදුරක් දරුණු ලෙසට ඇති වූ විට උන් අල්ලා මුට්ටියක දමා රුහුණු කතරගම දේවාලයට ගොස් භාරදී පොර පොල් පිටියක් පැවැත්වීම කොට දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම කරති. මෙම පූජා චාරිත්‍රයන්හි විද්‍යාත්මක ස්වභාවයන් සලකා බැලීමට නොහැකිය. නුමුත් ගොවි සමූහයක් විසින් කරන මෙවැනි ආයාචනා ප්‍රත්‍යක්ෂ කෙම් ක්‍රමයන් ලෙසට දීර්ඝ කාලයක් තිස්සේ පැවත පැමිණ ඇත.

## ශාකසාර සහ විවිධ ඖෂධ පදනම් කරගත් කෙම් ක්‍රම

පරිසරයේ දක්නට ලැබෙන විවිධ ඖෂධ පැළෑටිවල තිබෙන රසායනික සංයෝග කෘමි මර්දනයට ඉතා අගනා බව අත්දැකීමෙන්ම දීර්ඝ කාලයක් පසක් කරගෙන සිටි බව පෙනේ. කතුරු මුරුංගා කෙම, පරගෙඩි කෙම, දලුක්තැලීමල කුකුරුමාන් කෙම, නව නිල්ල කෙම ඒ අතරින් කීපයකි. කතුරු මුරුංගා කෙමෙ කරනු ලබන්නේ ගොයම පැළ අවදියේ දීය. ගොයම් කහ පැහැ ගැහී වර්ධනය බාල වන විට එයට හේතුව ගොවියා සොයා ගනී. කතුරු පණුවා නිසා ඇතිවන පණු රෝගය නිසා මෙලෙස සිදු වන බව ඔහු වටහා ගනී. මේ පණු උවදුරු මර්දනය කිරීමට වල් කතුරු මුරුංගා මුල් සපයා ගෙන කොටා යුෂ ගෙන ජලය මුසු කර ඉසීම මගින් රෝගය දුරු වේ.



දලුක් තැලීම සිදු කරනු ලබන්නේ පණු උවදුර මර්දනයටයි. ගොයම් පැළපත අවධියේ දී පත්‍ර මත ඇතිවන සුදු කොළ පුල්ලි රෝගය මර්දනයට දලුක් පිති කපා ලියැද්දේ තැන තැන දැමීම කරති. දලුක් කිරි ජලයට මුසු වන අතර මෙම රෝගයට හේතුවන පණුවා මර්දනය වේ. ගොයමට අල කොළ රෝගය වැළඳුණ කල්හි නව තිල්ල නම් කෙම කළ යුතුය. මෙම කෙම කිරීම සඳහා තිල් පැහැ කොළ නවයක්, උණුදඬුනවයක්, ගොක් කොළ නවයක් සහ කෙසෙල් කොළයක් අවශ්‍ය වේ. මෙම අතු නවය කපු මහතෙකු ගේ මාර්ග යෙන් ජීවම් කළ යුතුය. අනතුරුව කෙතේ ස්ථාන නවයක සිටුවිය යුතුය. සිවුරු කැබලි උපයෝගී කර ගත් පන්දම් මගින් කෘමි සතුන් ආකර්ෂණය කර ගැනීම ද පළවා හැරීම ද සිදු කරන ලදී. යන්ත්‍ර මන්ත්‍ර ආදී අභිචාර විධි අනුගමනය කරන කල්හි වුවද යම්කිසි සමාන බවක් දක්නට ලැබුණද පළාතෙන් පළාතට අනුගමනය කරන ලද ක්‍රම වේද වෙනස් බව පෙනේ. පළිබෝධකයින් පමණක් නොව ඇතැම් විට යම් කිසි දිළිර හානියක් ඇති වූ අවස්ථාවලදීද වගාව හානියට පත්වීම වළක්වා ගැනීමට අභිචාර විධි අනුගමනය කර ඇත. මධ



ගොවිතැන පිළිබඳ සලකා බැළුවහොත් එයට හානි කරන පළිබෝධකයින් සිටින්නේ අතලොස්සකි. ගොයමට හිත මිතුරු සතුන් රාශියෙකි. කෘෂි රසායන යෙදීමෙන් මිතුරු සතුන් ද වැනසෙති. එම නිසා පළිබෝධකයින් පමණක් පලවා හරිමින් කරන ගොවිතැන සම්පූර්ණයෙන්ම විද්‍යාත්මක විධි ක්‍රමයක් බව පෙන්වා දිය යුතුය.



පළිබෝධකයින් වගාවක සැරිසැරීම සිදු වන්නේ යම් කිසි කාලවකවානුවකදීය. උන්ගේ ජීවන රටාව තේරුම් ගැනීමෙන් මේ බව අවබෝධකර ගතහැකිය. ගොයම් මැස්සා පියාසර කරන සතෙකි. උන්ගේ බෝ වීම සඳහා කෙරෙන එක් වීම නිරීක්ෂණය කළහොත් මේ සතා පළවා හැරීම ට කෙරෙන විධි ක්‍රමය නිගමනය කළ හැකිය. පැරණියන් මණ්ඩේ ගැසීම නම් විද්‍යාත්මක ක්‍රමය අනුගමනය කරන ලද්දේ මේ එක් වීමට බාධා කිරීමටයි. එය සවස් වරුවේ කරන ලද්දකි. විශාල වශයෙන් පැතිරෙන දුඹුරු පැළ කීඩෑවා ගේද බෝ වීම මෙලෙස වළක්වා ගත හැකි බව දශක කීපයකට ඉහතදී පවා ගොවියන් සිය ප්‍රඥාව මගින් තේරුම් ගත්හ. ඒ සඳහා ඔවුහු වේගයෙන් සුළඟට සෙලවෙන පොල් අත්තක් යොදා ගන්නා ලදී. එහි එල්ලන ලද උදළු තැටිලි මේ සෙලවීමට සණ්ඨා හඬ නංවයි. එය ද සාමාන්‍යයෙන් සතුන් එක්වීම සිදු වන සවස් කාලයේ අටවා තබන ලද්දකි. උදලු තැටිල්ලෙන් ප්‍රතිරාව නිසා ගොයම් මැස්සන් ගේ බෝවීම වැළැක්වෙයි. ඒ අතරවාරයේ චන්ද්‍රයාගේ ගමන කලුවර පක්ෂයට හැරේ. එවිට ක්‍රමානුකූලව මැසි උවදුර පාලනයට ලක් වේ.



**මතුගම සෙනෙවිරුවන්**
පරිසරවේදී
ගලබඩයාවත්ත පාර, මතුගම
seneviruwan@gmail.com

# පාරම්පරිකව සතුන් රැකබලා ගැනීම සහ විශේෂ ප්‍රතිකාර

**විජේරත්න දුටුවැව**



ඉතිහාස ගත කරුණු අනුව වසර දහස් ගණනක් අපේ රටේ ගොවිතැන තිරසාරව පවත්වාගෙන එන ලද්දේ සත්ව-බෝග ඒකාබද්ධ ප්‍රවේශය තුළිනි. මෙය තවදුරටත් පැහැදිලි වන අවස්ථාවක් ලෙස, 'පැටිපස් පරානේ'සැලකිය හැකිය.

## පැටිපස් පරානේ

ශ්‍රී ලංකාවේ සතුන් ඇති කිරීමේ ඉතිහාසගත කරුණු දෙස විමසිලිමත් වනවිට 'පැටිපස් පරානේ' යන සංකල්පයට ලැබුනේ ප්‍රමුඛස්ථානයකි. කඩවර දෙවියන් විසින් කලාවැව රැකගත් ආකාරය අපි අසා ඇත්තෙමු. නුවර කලාවියේ මිනිසුන් කඩවර දෙවියන්ට පුදපූජා පැවැත්වීම වාර්ෂිකව කරණු ලබන චාරිත්‍රයකි. එහිදි කවියෙන් කරනු ලබන යාදින්නේ අවසන් පද දෙක මෙසේය.

**"පැටිපස් පරානේ රැකදෙන්නට කියලා කඩවර දෙවියනේ කී කවි ඉවර කලා"**

මෙහි 'පැටිපස් පරානේ' ලෙස හඳුන්වන්නේ එදා අපගේ ජාතියට වැදගත් වු පරාන පැටව් පස් දෙනා පිළිබඳවයි. එනම් ළමයා, ගවයා, බල්ලා, බළලා සහ කුකුළා මේ පස් දෙනාවේ. මෙම සියලු දෙනාගේ සහභාගිත්වය ගොවිතැනට සහ ජීවන පැවැත්මට අපේ මුතුන් මිත්තන් උදව්කරගත්තෝය.

ජාතියට පෝෂණය, ශ්‍රමය, බලය, මෙන්ම පොහොර ලබා දෙන ලද්දේ ගවයා විසිනි. ගොවියාට ගෙවත්තට, හේනට හා කුඹුරට වන සතුන් පැමිණීම පිළිබඳ සංඥාව ලබාදෙන ලද්දේ බල්ලා විසිනි. නිවසේ ඇති ධාන්‍ය සඳහා ආරක්ෂාව සලසා දුන්නේ බළලා වේ. කුකුළා ජාතියට වේලාව මතක්කරදුන් අතර පෝෂණයටද දායක විය. මානව වර්ගයාගේ තිරසාර පැවැත්මේ සංකේතය වූයේ ළමයාය. එබැවින් පැටිපස් පරානේදි මුලින්ම කියවෙන්නේ ළමයා වේ. ඒ, මිනිසාට වටිනාම සම්පත දරු සම්පත වූ බැවිනි. ගව සම්පත දෙවැනි වූයේ දරු සම්පතට පමණි. ජල සම්පත හා වන සම්පත ද මෙම සිවු සම්පත්වලට ඇතුළත්ය.

## ජෛව විවිධත්වය, සතුන් ආරක්ෂා කරගැනීම සහ හෙළ ගොවිතැන

අතීතයේ දී අපගේ මුතුන්මිත්තන් තම කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා කුරා කුඹියාගේ පටන් දැවැන්ත හස්තිරාජයා දක්වාම සහභාගිකර ගත්තේය. කැලෑ එළවුම් යාතිකාව එයට කදිම සාක්ෂියක් වේ. හේන් ගොවිතැනේදි හේන පුළුස්සා ගැනිමේදි මෙය භාවිතා විය. මෙම යාතිකාව හඬනගා කියමින් වරු තුනක් හේන වටේ ගොස් අවසානයේ දි හේනට ගිනිතබයි. කුරා කුඹියාගේ සිට බූටැවේ මහ ඇත්තා (අලියා) දක්වාම වූ සියලු ප්‍රාණීන්ට ඉවත්ව යන ලෙස වරු තුනක් අඛණ්ඩව කෑ ගසමින් ගොවියා ඉල්ලා සිටි. මෙම හේන රැකෙන්නේ මෙම සතුන් විනාශ කිරීමෙන් නොව රැකබලා ගැනීමෙන් පමණක් වන බව සිය අත්දැකීමෙන් හේන් ගොවියා දැන සිටි නිසාය. 'Animal Husbandry' යන ඉංග්‍රීසි වචනය සිංහලයට පරිවර්තනය කර ඇත්තේ 'සත්ව පාලනය' ලෙසය. 'Husbandry' යනු 'පාලනය' නොව 'රැකබලා ගැනීම' වේ. අපගේ මුතුන් මිත්තන් මෙරට පෙරදිග ධාන්‍යාගාරය කර ඇත්තේ බෝග වගාව මෙන්ම සතුන්ද රැකබලා ගැනිම තුළිනි. සතුන් සහ ශාකවල ජීවන පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා ජෛව විවිධත්වය උපයෝගී කරගෙන සමෝධාන (integrated) ගොවිතැන් රටාවක්



විද්‍යාත්මක පදනමකින් භාවිතා කළ ජාතියක් ලෙස හෙළයන් හැඳින්විය හැකිය.

## පරිසර පද්ධතියේ සියලු සතුන්ගේ සහයෝගය ගොවිතැනට

සත්ව-බෝග ඒකාබද්ධතාව ඉහළින්ම භාවිත කළ අවස්ථාවක් ලෙස හේන හඳුන්වාදිය හැකිය. බෝග වර්ග 9 කට අධික සංඛ්‍යාවක් මිශ්‍රව වගාකළ නිසා ඒ ඒ භෝගවලට හානිකරණ සතුන්ගේ ගහණය වැඩිවීම සීමා කාරීවිය. ඒ තුළින් රෝග පාලනය ස්වභාවිකව සිදුවිනි.

නියරේ, තුඹසේ, අගලේ සහ වනාතේ රැඳි සිටින ගොවියාට හිතකර සතුන් ගොයම ආරක්ෂාකර දුන් අතර උඩරට ගෙවත්තේ තිරසාරත්වය තහවුරු වී ඇත්තේද විවිධත්වය නිසාය.

අපගේ පාරම්පරික ගොවිතැන පරිසර පද්ධතියේ සිටින සියළුම සතුන් ආරක්ෂා කරගනිමින්, ජීවින්ගේ විවිධත්වය ගොවිතැනට උදව්කරගත් ගොවිතැන් ක්‍රමයක් විය.

## ගෘහාශ්‍රිත සතුන් ආරක්ෂාකර ගැනීම

අප ජන සමාජය තම ජීවන පැවැත්මේ තිරසාරත්වය උදෙසා ගෘහාශ්‍රිත සතුන් ආරක්ෂා කර ගැනීමට විශේෂ අවධානයක් යොමුකර ඇත. සතුන්ගේ ලෙඩරෝග හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිකාර කර එම සතුන් ආරක්ෂාකර ගැනීමට ක්‍රියාකර තිබේ. ගෘහාශ්‍රිත සතුන් සඳහා ප්‍රතිකාර කිරීමේ දිගු ඉතිහාසයක් අපට ඇත. එය රාවණා රජ සමය දක්වා දිවෙන බව සඳහන් වේ. එකල සිටි 'සුශේන' නම් වෛද්‍යවරයා සත්ත්ව වෛදකම පිළිබඳ ප්‍රසිද්ධියක් ලබා සිටි කෙනෙකු බව කියවේ. අනුබුදු මිහිඳු හිමියන් මෙරටට වැඩම කරන විට ඒ සමඟ පැමිණි පිරිස අතර සත්ත්ව වෛදකමේ විශේෂඥයින් ද වූ බව ඉතිහාසගත තොරතුරුවල සඳහන් වේ.

දේශීය සත්ත්ව වෛදකම අත්දැකීමෙන් පෝෂණය වූ ප්‍රායෝගික වෛද්‍ය ක්‍රමයක් බව පෙනීයයි. මෙම දැනුම පරම්පරාවෙන් පරම්පරාවට ගලා ගියේය. අත්හදාබලා පරීක්ෂා කිරීමෙන් පසුව ඇතැම් කරුණු පුස්කොළ පොත්වල ලියාතබන්නට ජීවකයෝ කටයුතු කළහ.



## පරපුරෙන් පරපුරට වෛදකම

බදුල්ලේ 'අනාගතේ අපේ අතේ' සංවිධානයේ වැඩසටහනකට අනුව 2000 දශකයේ අවසාන භාගයේ දී භාෂිනී දිසානායක මහත්මිය සමඟ දේශීය පශු වෛද්‍ය පරමපරාවන් කිහිපයක් හමුවීමට මම ගියෙමි. එහිදි හමුවූ වෙද පරම්පරාවන් කීපයක් මෙසේය.

- ❖ පල්ලේපේරුව වෙද පරම්පරාව - ලූණුවත්ත
- ❖ විහාරවත්ත වෙද පරම්පරාව - පුහුල්පල
- ❖ දෙලුම්ගහකොටුව වෙද පරම්පරාව - හන්තානන්ගොඩ
- ❖ පතන්බොක්ක වෙද පරම්පරාව - වැලිමඩ

## දේශීය ගව වෛදකම බිඳවැටීම

පරපුරෙන් පරපුරට රැකගෙන පැමිණි දේශීය පශු වෛද්‍ය ක්‍රමය 1980 දශකය මැද භාගය වනවිට බිඳ වැටිණ. එයට හේතුවුයේ හරිත විප්ලවය සමඟ පැමිණි කෘෂිකර්ම ක්‍රමවේදය නිසාය. සීසෑමට ගවයා වෙනුවට ට්‍රැක්ටරය ආදේශ කළ අතර සත්ත්ව පොහොර වෙනුවට රසායනික පොහොර හඳුන්වාදුන්නේය. දේශීය ගව වෛදකම වෙනුවට බටහිර පශු වෛද්‍ය ක්‍රමය රාජ්‍ය අනුග්‍රහය යටතේ හඳුන්වාදෙන ලදි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට යම් වැඩපිළිවෙලක් රජය දියත් කළත් දේශිය පශු වෛද්‍ය ක්‍රමය ගැන කිසිදු අවධානයක් රාජ්‍ය මට්ටමින් යොමු නොවීම කණගාටුවට කරුණකි. ජර්සි (Jersey), ෆ්‍රීෂියන් (Friesian), අයෂයර් (Ayrshire) වැනි ගව වර්ග ආනයනය කර කිරි ගවයින් ලෙස ගොවීන්ට ලබාදෙන ලදී. පාන්දරින් හඬලන දේශීය කුකුළා වෙනුවට වැඩිදියුණු කරන ලද මස් පිණිස කුකුළන් (Broiler) සහ බිත්තර සඳහා කිකිළියන් (Layers) සීඝ්‍රයෙන් ව්‍යාප්තවී ගියේය. අපට ආවේනික එළුවර්ග වෙනුවට සානන් (Saanen), ජමුනාපාරි (Jamunapari) වැනි එළුවර්ග හඳුන්වා දුනි. එයට සමගාමීව දේශිය ගවයා, එළුවා මෙන්ම කුකුළා ද ගොවියා විසින් මසට විකුණා දැම්මේය. ඒ සමගම දේශීය පශු වෛද්‍ය ක්‍රමය ද අභාවයට ගියේය. එම වෛදකම විධිමත් ග්‍රන්ථාරූඪ කරණයක් සිදු නොවූ බැවින් මෙවනවිට බොහෝ තොරතුරු අප අතරින් ගිලිහී ගොස් ඇත. එහෙත් තවමත් දේශීය පශු වෛදකම නොනැසී



පවතින්නේ එහි ඇති විද්‍යාත්මක පදනමක් සහිත බොහෝ ගුණාංග නිසාය.

## කාබනික ගොවිතැන සමඟ පාරම්පරික සත්ත්ව වෙදකම නැවත භාවිතයට

ලොව මිනිසුන් රසායනික කෘෂිකර්මයේ අනිටු විපාක අත්දැක කාබනික ගොවිතැනට නැඹුරු වෙමින් සිටී. කාබනික ගොවිතැනේ දී සතුන් සඳහා ප්‍රතිජීවක (Antibiotics) සහ වස විස භාවිතය තහනම් වේ. එබැවින් නැවතත් ලොව බොහෝ රටවල් පාරම්පරික පශු වෛද්‍ය ක්‍රම (Ethnoveterinary) සොයා යමින් සිටී.

## දේශීය ගව වෙදකම

ගව රෝග සහ ඒවාට කළ ප්‍රතිකාර පිළිබඳව ඇතැම් වෙද පරම්පරාවල් පුස්කොළ පොත්වල ලියා සංරක්ෂණය කරගනිමින් එම දැනුම පරපුරෙන් පරපුරට රැගෙනවිත් ඇත.
සෑම ගව වෙදදුරකුම වෙදකම සඳහා ශක්තීන් ත්‍රිත්වයක බලය ලබාගෙන තිබේ.
ඒවා නම්
- ❖ භෞතික ශක්තිය
- ❖ අන්තරික්ෂ ශක්තිය
- ❖ ආධ්‍යාත්මික ශක්තිය වේ.

## භෞතික ශක්තිය



බොහෝවිට භාවිතා කර ඇත්තේ ශාක වල කොටස්, තෙල් වර්ග ආදියයි.

## අන්තරික්ෂ ශක්තිය

හිරු, සඳු ඇතුළු ග්‍රහතාරකාවන්ගේ ගමන් මාර්ගය අනුව ඇතිවන පරිසරික වෙනස්කම් ද දේශීය ගව වෙදකමේ දී සැලකිල්ලට ගෙන ඇත. බෙහෙත් සඳහා ඇතැම් ශාක කොටස් ලබා ගැනීමේ දී උදේ සහ සවස පිළිබඳව සැලකිලිමත් වීමත්, ශාක මුල ගමන් කර අති දිශාව සැලකිල්ලට ගැනීමත් මෙහිදී පෙන්වාදිය හැකිය. එමෙන්ම ජ්‍යොතිෂ්‍යයේ සඳහන් පංචාංග නියාමයේ අංගයන් වූ හෝරාව, ථිතිය, කරණය ආදීය කෙරෙහි ද විශේෂ අවස්ථාවලදී අවධානය යොමුකර ඇත.

## ආධ්‍යාත්මික ශක්තිය

චිත්ත ශක්තිය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් මෙසේය.
- ❖ බෙහෙත් ගසට වැඳනමස්කාර කර බෙහෙත් ගසෙන් කොටසක් ලබා ගැනීම. (වත් පිළිවෙත්)
- ❖ පිරිත
- ❖ කෙම් ක්‍රම
- ❖ යන්ත්‍ර මන්ත්‍ර

ආධ්‍යාත්මික විද්‍යාව (spiritual science) පිළිබඳ බටහිර දාර්ශනිකයකු වූ රුඩෝල්ෆ් ස්ටයිනර් මෙසේ කීවේය.
"Matter is never without spirit
Spirit is never without matter"
එනම් ආධ්‍යාත්මයක් නොමැතිව භෞතික දෙයක් නොමැති බවත් භෞතික දෙයක් නොමැතිව ආධ්‍යාත්මයක් නොමැති බවත්ය.

## ගව රෝග වෙන්කොට හඳුනා ගැනීම

සියලුම ගව රෝග සඳහා දේශීයව නිශ්චිත නාමකරණයක් සොයාගැනීම අසීරුය. පුස්කොළ පොත් සහ පුරාණ



ග්‍රන්ථවලට අනුවූ ඒවා ප්‍රධාන වශයෙන් හඳුන්වා ඇත්තේ 'වෙප්පු' සහ 'අඩප්පන්' වශයෙනි. බොහෝවිට ඒවා දක්නට ලැබෙන්නේ කවියෙනි.

**බඩපුරවා උස්මුරුතාවට එන්නේ**
**ලන්දේ දුවමින් කෑම නොකන්නේ**
**අන්ද මන්ද වී දුව ඇවිදින්නේ**
**වෙප්පු අඩප්පන් ඉන් දැනගන්නේ**

වෙප්පු සහ අඩප්පන් වෙන්කර හඳුනාගැනීමට තරම් දැනට තොරතුරු නොමැත. එහෙත් ගවයින්ට වැළඳෙන ප්‍රධාන රෝග කිපයක් පිළිබඳව වෙද පොත්වල පැහැදිලිව දක්වා ඇත.

## ගව වසංගතය

අතීතයේ දී අපේ රටේ පැවැති භයානකම ගව රෝගය වූයේ රක්තාශ්‍රව ගව වසංගතයයි (*Hemorrhagic Septicemia*) ඒ පිළිබඳව එක් වෙදපොතක මෙසේ සඳහන් කර තිබිනී,

**බෙල්ල නමා ගෙරවුම හට ගන්නේ**
**නහෙන් කටෙන් පෙනහළු දමමින්නේ**
**කම්මුල් දෙක හිර කරගෙන එන්නේ**
**වසංගතය බව ඉන් දැන ගන්නේ**

## දේශීය ප්‍රතිකාර

බටහිර පශු වෛද්‍ය ක්‍රමයට අනුව මෙම රෝගයෙන් ගවයින් මරණයෙන් බේරා ගැනීමට නම් සඳහා ප්‍රතිශක්තිකරණ එන්නත් (HS) කළ යුතුය. දේශීය වෙදකමේ දී රෝග ලක්ෂණ දුටු විගස ප්‍රතිකාර කරන්නේ නම් මරණයෙන් බේරාගත හැකිය. ගොන්ගොරඩි (ගවයින් තප්පුලන විට කටින් එළියට විසිවන කොටස්) සහ කුකුරුමහ පුළුස්සා එඬරු තෙල් සමඟ බීමට දීම කරයි. ඒ සමඟම ඇහැල ගසේ කොළ අත්තකින් මැතිරීම ද කරණු ලැබේ.

## කුර හා මුඛ රෝගය (Foot and mouth disease)

මෙය "කුරගාය සහ කටගාය" නැතිනම් කුරලෙඩ සහ කටලෙඩ ලෙස හඳුන්වයි. වෛරස් රෝගයකි. යුරෝපීය ගවයින්ට සාපේක්ෂව දේශීය ගවයින්ට මෙම රෝගය වැළඳුණු පසු ඔරොත්තු දීමේ ශක්තිය ඇත. එබැවින් අතීතයේදී එක් ගවයෙකුට මෙය වැළඳුනු පසු එම බේටය ගව පට්ටියේ අනෙක් ගවයින්ගේ ද බේටයට ගැවීමට සලස්වා සියළුම ගවයින්ට එකවර රෝගය සෑදී සුවවීමට සලස්වා තිබේ. කුරවල තුවාල වලට විෂබීජ ඇතුල්වී ද්විතීක ආසාදන වැළැක්වීම සඳහා දින 1-2 ක් මඩේ බැඳීම සිදුකර ඇත.





දඹ පොතු, කුඹුක් පොතු, කරඳ පොතු සමව ගෙන එම ස්ථානයේ මඩ සමඟ කලවම්කර ගවයා බඳිනු ලැබේ.

මුඛයේ තුවාල උත්සන්න වීම වළක්වා ගැනීමට අන්නාසි ගසේ කඳක් ගෙන එයට සීනක්කාරන් තවරා උගුරට දමා අතුල්ලා තුවාල පිරිසිදු කරණු ලැබේ.

## තවත් ප්‍රතිකාර

දේශීය සත්ත්ව ප්‍රතිකාරවල විශේෂ ලක්ෂණයවන්නේ අහිතකර අතුරු ඵලයන් අවම වීමයි. එයට හේතු වන්නේ ප්‍රතිකාර සඳහා යොදාගනු ලබන්නේ ඖෂධීය ගුණයෙන් යුක්ත ශාඛවල කොටස් වීමයි. ශ්‍රී ලංකාවේ ඒ ආකාරයට සත්ව ප්‍රතිකාර සඳහා බහුලවම භාවිතා කරණ ශාඛ වර්ග කිහිපයක් පහත සඳහන් වේ.

1. නික (*Vitex negundo* L.)
2. ආංකෙන්ද (*Acronychia pedunculata*)
3. දෙහි (*Citrus aurantifolia Christm.*)
4. කුරුඳු (*Cinnamomum zeylunicum Blume*)
5. කොහොඹ (*Azadirachta andica A.*)
6. ඉඟුරු (*Zingiber officinzle Roscoe*)
7. සුදුලූණු (*Allium sativum* L.)
8. මී (*Madhuca longifolia* L.)
9. ගොරකා (*Garcinia quaesita Pierre*)
10. කහ (*curcuma longa* L.)
11. වදකහ (*Acorus calamus* L.)
12. පොල් (*Cocos nucifera* L.)
13. කරඳ (*Pongamia pinnata* L.)
14. දියලුනු (*Sodium chloride*)
15. කරපිංචා (*Murraya koenigii* L.)
16. මුරුංගා (*Moringa oleifera Lam.*)
17. කොත්තමල්ලි (*Coriandrum Setivum* L.)
18. පාවට්ටා (*Adathoda vacica*)
19. අරළු (*Terminalia chebula Retz.*)
20. බුළු (*Terminalia bellirica*)
21. ගම්මිරිස් (*Piper nigrum* L.)
22. දිවිකඳුරු (*Pagiantha dichotoma*)
23. උඳුපියළිය (*Desmodium triflorum* L.)
24. කුඹුක් (*Terminalia arjuna*)
25. කප්පරවල්ලිය (*Plectranthus amboinicus*)
26. අත්තන (*Datura metel* L.)
27. කරාබු නැටි (*Syzygium aromaticum* L.)
28. කහට (*Careya orborea Roxb*)
29. කංසා (*Cannabis sativa* L.)
30. හාල් (*Oriza sativa*)

එක් එක් රෝගය අනුව තෝරාගත් බෙහෙත් ද්‍රව්‍ය ලබාගන්නා ප්‍රමාණයේ වෙනස්කම් ඇත. එම ප්‍රමාණයන් දක්වා ඇත්තේ මිටක්, පතක්, දෝතක්, කළඳක් වැනි මිණුම් ආකාර වලටය. සමව ගෙන කොටා, මිරිකා, දියරයක් ලෙස පෙවීම, තම්බාගැනීම, ගුලි සකස්කර ගැනීම, අලේප කිරීම සහ නස්න කිරීම වැනි ක්‍රමවේද මෙහිදි භාවිතාවේ.

## දේශීය ගව වෙදකමේදී බෙහෙත් වර්ග සාදා තබාගැනීම

දේශීය සත්ත්ව වෙදකමේ දී බෙහෙත් වර්ග සාදා තබාගෙන වෙදකම් කර ඇත්තේ ඉතා අල්ප වශයෙනි. බොහෝ විට සිදුකර ඇත්තේ නැවුම්ව (Raw) ලබාගත් බෙහෙත් ද්‍රව්‍ය එම මොහොතේම භාවිතයයි. එහෙත් සාදා තබාගෙන භාවිතා කරනු ලබන බෙහෙත් වර්ග කිහිපයක් ද ඇත.

## මහා ගවරාජ ගුලිය

බෙහෙත් වර්ග 13ක් කලඳ බැගින් ගෙන ගම්මිරිස් යුෂයෙන් අඹරා ගුලි ලෙස සකස්කර සෙවනේ වේලාගත්

පසු මෙලෙස හැඳින්වේ. වෙප්පු සහ අඩප්පන් ඇති වූ විට නිකකොළ ඉස්ම සමඟ ගවයාට පොවනු ලැබේ. නස්න කිරීමට ද එය යොදා ගනී.

## දිව්‍ය වෘතිකාව

ගවයින්ගේ ආමාශ ගත රෝග සඳහා සාදාගත් බෙහෙතකි. බුලත් දළු සහ තවත් බෙහෙත් වර්ග 09ක් රැගෙන ඉඟුරු යුෂත් සමඟ අඹරා අනෝදා ඇට පමණට ගුලිකර තබාගනු ලැබේ. අසනීපවූ විට කප්පරවල්ලිය කොළ හෝ මඳුරුතලා කොළ යුෂ සමඟ බීමට දෙනු ලැබේ. සියළුම රෝග සඳහා ප්‍රතිකාරයක් ලෙස සකස් කරගත් තෛලය හඳුන්වනු ලබන්නේ 'මේනිස්වාදී තෛලය' නමිනි. පාචනය සුවකරගැනීම සඳහා සකස්කරගත් ගුලි මෙන්ම පණු අමාරුව සඳහා සකස් කරගත් ගුලි ද (පණුගුලිය) ඒ ඒ වෙද පරම්පරවල දක්නට ලැබේ.

## යන්ත්‍ර පිලිස්සුම්

සත්ත්ව රෝග සුවකර ගැනීම සඳහා නිල ස්ථාන පිළිස්සීම දේශීය වෙදකමේ විශේෂිත වූ ක්‍රම වේදයකි. මේ සඳහා භාවිතා කරනු ලබන්නේ යකඩින් කැනූ කටුය. මේවා 'කුරි කටු' නමින් හැඳින්වේ. අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ගවයින් හණ ගසනු ලබන්නේ මෙම කටු



භාවිතයෙනි. රෝගයට අදාළ යන්ත්‍රය නිවැරැදි ස්ථානයේ නිවැරැදිව පිළිස්සීම වැදගත්වේ. ප්‍රථමව සතාට බෙහෙත් ලබාදී යන්ත්‍ර පිළිස්සීම කරනු ලබන්නේ ඉක්මන් සුවය සඳහාය.

නිදර්ශනයක් ලෙස රෝමාන්තික සතෙකු බඩපුරවා දමා දිගු වෙලාවක් වැතිර සිටි විට ස්වසන අපහසුතා ඇතිවී සතා මිය යාමට එම වැතිර සිටීම ම හේතුවක් වේ. එවිට බඩ විරේකවීමට සුදුසු බෙහෙතක් ලබාදී පහත යන්ත්‍රය උදරය පෙදෙසේ පුලුස්සනු ලැබේ.
මෙම නිල පීඩනයන් සමඟ වැතිරී



සිටින ගවයා ක්ෂණික නැගීසිටින අතර ජීවිතය මරණයෙන් බේරේ. බොහෝ දේශීය පශු වෛද්‍යවරුන්ගේ අදහස වන්නේ නිල පිලිස්සුම් ක්‍රමය "කෙම්" ක්‍රමයක් බවය.

## කෙම් ක්‍රම

රෝග සුවකරගැනීම සඳහා 'කෙම් ක්‍රම' භාවිතය ඉතාමත් ආශ්චර්ය ජනක ක්‍රමයකි.

## කෙන්ගෙඩිය

ඖෂධ වර්ග 5ක් සමව ගෙන අඹරා ගුලියක් සේ සකස් කර පට්ටා ලණුවක ගැටගසා අතපය කැඩී රෝගී වී සිටින ගවයින්ගේ බෙල්ලේ බඳිනු ලැබේ. 'කෙන්ගෙඩිය' නැමැති මෙම ඖෂධ පොට්ටනිය වේලී යනවිට ගවයා ද සුවය ලබයි. මෙහි අඩංගුවන්නේ අදාළ වෙද පරපුරේ ඉතාම රහසිගත බෙහෙත් වේ. මෙම බෙහෙත් ගස්වලින් කඩාගනු ලබන්නේ 'නව වැඳුම' වැඳීමෙන් පසුව ඉතාම ගෞරවයෙනි. ඉන්පසු බෙහෙත් සකස්කර බෙල්ලේ බඳින තුරු වෙදැදුරු කථා නොකරයි. එමගින් ආධ්‍යාත්මික ශක්තිය භාවිතයට ගැනේ.

## අබ මතුරා ලිපට දැමීම

ගවයකුගේ තුවාලයක පණුවන් සිටීනම් ගව හිමියා වෙද මහතා වෙත ගොස් ඒ බව සැලකරයි. වෙද මහතා අබ (*Brassica juncea* L.) සත් මිටක් මතුරා ගොවියාට ලබාදේ. ගොවියා එතැන් සිට කථා නොකර ගවයා අසලට ගොස් එම අබ ලිපට දමා පිළිස්සිය යුතුය. එවිට තුවාලයේ පණුවන් හැලීයන බව ගොවීන්ගේ අත්දැකීමයි. ඇතැම් ප්‍රදේශවල වෙදදුරන් අබ සහ අළු (Ash) යන දෙවර්ගයම භාවිතා කරයි. අබ මතුරා ලිපට දමා ඉන්පසුව අළු මතුරා තුවාලයට දමයි.

ප්‍රායෝගිකව ගොවින් අත්දුටු දේශීය සත්ත්ව වෙදකමේ විද්‍යාත්මක පදනම නැවත පර්යේෂණය කර සනාථ කරගෙන භාවිතයට ගැනීම කාලීන අවශ්‍යතාවයක්ව පවතී. ශ්‍රී ලංකාවේ ගොවිතැනේ තිරසාරත්වය රඳා පවතින්නේ අතීත අත්දැකීම් ද මුසුකරගත් සමෝදාන ගොවිතැන් ක්‍රම වේදයක් තුළ පමණි.



**විජේරත්න දුටුවැව**
(ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශයේ හිටපු ජ්‍යෙෂ්ඨ ගොවිපල කළමණාකරු)

# සම්ප්‍රදායික කෘෂි පසුඅස්වනු පිළිවෙත් තුළින් ආහාර සුරක්ෂිතතාව කරා..

මහාචාර්ය සංජීවනි ගිනිගද්දර



"සබ්බේ සත්තා ආහාරත්තිකා "
සියලුම සත්වයින් ආහාර මත යැපෙන්නෝ වෙති.

"ආහාර" යනු හුදෙක් අප අනුභව කරන දෙයම පමණක් නොව, ආහාර නිෂ්පාදනයේ සිට පරිභෝජනය දක්වාවන ක්‍රියාවලිය සමග බද්ධව පවතින සිරිත් විරිත්, සංස්කෘතිය සහ විශාල පිරිසකගේ දායකත්වය සහ කැපවීම යන සියල්ලේම සම්මිශ්‍රණයකි. අතීත ශ්‍රී ලාංකිකයන් ආහාර යොදාගත්තේ හුදෙක්, කුසපුරවන්නට පමණක්ම නොව, තම අදහස් සහ හැඟීම් එකිනෙකාට සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රකාශන මාධ්‍යයක් ලෙසත් එය යොදාගත්හ. ආහාර කෙරෙහි ඔවුන් දැක්වූ ගෞරවය නිසාම, ආහාර නිෂ්පාදනයේ සිට අහාර පිසගැනීම දක්වාත්, පරිභෝජනය කිරීමේදීත්, ඉන් නොනැවතී අතිරික්ත අහාර නිසිලෙස ගබඩා කිරීම සහ පරිරක්ෂණයේදීත්, ඉතාමත් සැලකිල්ලකින් යුතුව කටයුතු කළහ.

වර්තමානය වනවිට ආහාර, අර්බුදයක් බවට පත් වී ඇත. ලෝක කුසගින්න පිළිබඳ සංඛ්‍යාන දත්තවලට අනුව, ලෝක ජනගහනයට සරිලන ආහාර ප්‍රමාණයක් නිපදවා තිබුනද මිලියන 811 පමණ වන පිරිසක් කුසගින්න සමග අනවරත අරගලයක නිරත වෙමින් සිටිති. ලෝක කෘෂිකර්ම සහ ආහාර සංවිධානයට අනුව ලෝක ජනගහනයෙන් බහුතරයකට ආහාර නාස්තිය පුරුද්දක් බවට පත් වී ඇත. පර්යේෂණ වාර්තාවලට අනුව නිෂ්පාදනයවන ආහාර ප්‍රමාණයෙන් 1/3 ක් ප්‍රමාණයක් අපතේ යන තත්වයට පත් වී ඇත. ආහාර නාස්තිය යාන්ත්‍රික හානි, බෝගවලට වැළදෙන රෝග ආදී බාහිර සාධක මෙන්ම භෞතික වශයෙන් සිදුවන නරක්වීම් ආදී අභ්‍යන්තර හානි මගින්ද සිදුවේ. විධිමත් නොවූ ගබඩා කිරීමේ ක්‍රමවේද, ආහාර ඇසුරුම් සහ ප්‍රවාහනයේදීත්, ගෘහස්ත මට්ටමේදී සිදුවන අනවශ්‍ය ආහාර අපතේ යෑම ද සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. ආහාර නාස්ති වීමේදී එය සිදුවන්නේ ප්‍රමාණාත්මකව පමණක් නොවේ, ආහාරයක් ගුණාත්මක වටිනාකමටත් එයින් විශාල බලපෑමක් සිදුවේ. පර්යේෂණ දත්ත වලට අනුකූලව දියුණු වෙමින් පවතින් රටවල 40% කට වැඩි ප්‍රතිශතයක් ආහාර හානිය පසු අස්වනු අවස්ථාවේ සහ ආහාර සකස් කිරීමේදී සිදුවන අතර, කාර්මීකරණය වූ රටවල්වල 40%ට වැඩි ප්‍රතිශතයක් ආහාර හානිය සිදුවන්නේ වෙළඳපොළ ආශ්‍රිතව සහ පරිභෝජනයේදීය. එපමණක් නොව ඇස්තමේන්තු ගත කර ඇති ආකාරයට සංවර්ධනය වෙමින් පවතින රටවල පහසුවෙන් නරක්වන පලතුරු, එළවලු ආදියේ පසු අස්වනු හානිය 30-40% දක්වා අගයක් ගනී.

පසු අස්වනු තාක්ෂණය යනු අස්වැන්න නෙලීමෙන් පසු එහි ආරක්ෂාව සහතික කිරීම සඳහා, සංරක්ෂණය, සැකසීම, ඇසුරුම්, බෙදාහැරීම, අලෙවිකරණය සහ භාවිතය යන කරුණු වලට



සැලකිල්ලක් දක්වමින් පරිභෝජනය කරන ජනගහනයෙ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීමේ පිළිවෙත්

සමුදායකි. අතීත ශ්‍රී ලාංකිකයා සතුව පසු අස්වනු තාක්ෂණය සහ ආහාර ගබඩා කිරීම සහ පරිරක්ෂණය පිළිබඳව පැවති දැනුම පිළිබඳව සලකා බලන විට එය කෙතරම් සැලසුම් සහගතද යන්න අපට අවබෝධ කරගත හැකිය. ආහාර ගබඩා කිරීම සහ පරිරක්ෂණය කිරීම සඳහා සම්ප්‍රදායික ක්‍රම කිහිපයක් හඳුනා ගත හැකිය. වියළීම, ලුණු දැමීම, සීනි හෝ පැණි දැමීම, අච්චාරු දැමීම වැනි ක්‍රම වේද මේ අතර ප්‍රධාන ස්ථානයක් ගනී. අතීත ශ්‍රී ලාංකිකයෝ ආහාර නිෂ්පාදනය හැසිරවීම්, ඇසුරුම්, ගබඩා කිරීම සහ සකස් කිරීමේ ක්‍රමවේද සහ ඒවායේ පසුකාලීන දේශීය තාක්ෂණික ක්‍රමවේදයන් උපයෝගී කරගත් ඒවා විය. පැරැන්නන්ගේ ආහාර පරිරක්ෂණය ප්‍රධාන වශයෙන් කරුණු ද්විත්වයක් පදනම් කරගෙන සිදු විය. එනම්, ආහාර හිග, අවාරයේදී ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ, අහාර නරක්වී විනාශ වී යාම වළක්වා ගැනීමටයි. ආහාර පරිරක්ෂණයේදී සලකා බලන ප්‍රධාන කරුණු වන්නේ උෂ්ණත්වය පාලනය, ඔක්සිජන් ප්‍රමාණය පාලනය, තෙතමන ප්‍රමාණය පාලනය සහ පී .එච් අගය පාලනයයි. මෙම කරුණු සියල්ලම පැරණි ආහාර පරිරක්ෂණ ක්‍රමවේදවලදී භාවිතා වී



හතු වර්ග, මාළු වියලා ගැනීමට ලක් කරන ලදී. මාළු ලුණු දමා වියලා ගැනීමෙන්, රස වැඩි කරන ලද ආහාරයක් බවට පත් කරගැනීම වැනි ක්‍රමවේද භාවිතය මගින්, එක ක්‍රමවේදයක් පවා කෙතරම් විවිධාංගිකරණයට ලක් කර ගෙන ඇතිදැයි අපට අවබෝධ කරගත හැකිය. එපමණක් නොව දුම් ගැසීම මගින් විවිධ මස් සහ මාළුවර්ග වියළීමට ලක් කර ගන්නා ලදී. එකළ පැවති තාක්ෂණය පිළිබඳව සලකා බලන්නේ නම්, දුම් ගැසීමේදී භාවිතා කළ දර වර්ග පිළිබඳවත්, අව්වේ දමා වියලා ගැනීමේදී අව්ව ලැබෙන ප්‍රමාණය පිළිබඳවත් සැලකිල්ලක් දක්වා තිබුණි. කොස්, දෙල් යනු වර්තමානයේදී පවා ශ්‍රී ලංකාවේ බහුල ශාකමය අහාර වේ. කොස් සහ දෙල් පල දරන කාල සීමා වලදී, එම ගස් ඇසුරේ කෙතරම් පල ප්‍රමාණයක් අපතේ යනවාද යන්න පිළිබඳව අත්දැකීම් අපට පවතී. නමුත් පැරැන්නන් කොස් සහ දෙල් වියලිමෙන්ද, කොස් ඇට, කොස් මදුළු සහ දෙල් පමණට තම්බා වියලා ගැනීමෙන් අටු කොස් ආදිය සකසා ගැනීමෙන්ද, අවාරයේදී පරිභෝජනය සඳහා තබා ගත්තෝය.

ලුණු දැමීම මගින් ආහාර කල් තබා ගැනීමේදී සිදුවන්නේ, ආස්‍රැතිය මගින් ආහාරයේ තෙතමන ප්‍රමාණය ඉවත්වී එහි ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය අඩපන වීමයි. ආහාරයක ජලය ඉවත් කර ගැනීමට සාන්ද්‍ර ද්‍රාවණ යොදා ගත හැකි බව මුතුන් මිත්තන් දැන සිටියේ අත්දැකීමෙන්ය. ලුණු දෙහි, ලුණු දමා වියලන ලද මාළු, කරවල, ලුණු දැමූ අඹ

භාවිතය සඳහා විවිධ ක්‍රමවේද භාවිතා කළා පමණක් නොව කෘෂි දේශගුණික විවිධත්වය අනුව වෙනස් කර භාවිතා කිරීමට ද සමත් කමක් දැක්වුහ.

පසු අස්වනු හානි වැළැක්වීම සහ භාවිතය සඳහා ඵලදායී ලෙස අතිරික්තය යොදා ගැනීම, අවාරයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒවා තබා ගැනීමේ හැකියාව, ආහාරවල පෝෂණ අගය වැඩි දියුණු කිරීම, පාරම්පරික දැනුම ඊළඟ පරම්පරාවට මාරු කිරීම, අඩු නිෂ්පාදන පිරිවැය, සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කිරීම, හානිකර කල් තබා ගන්නා ද්‍රව්‍ය එකතු නොකළ නිසා ගුණාත්මකභාවය ආරක්ෂා වීම, පෙනුම සහ රසය වැඩි දියුණු කිරීම වැනි කරුණු නිසා සම්ප්‍රදායික පසු අස්වනු සහ ගබඩා කිරීමේ ක්‍රමවේද වඩාත් වාසිදායක විය.

අතීත ශ්‍රී ලාංකිකයන් උපයෝගී කරගත් පසු අස්වනු තාක්ෂණයට අදාළ ආහාර පරිරක්ෂණ ක්‍රමවේද, සරල, කාලෝචිත එමෙන්ම ආර්ථිකමය වශයෙන් තිරසාර, තිබීම විශේෂත්වයකි. එම දැනුම ඔවුන් ලබාගත්තේ විද්‍යාගාර වල සිදුකරන ලද පර්යේෂණයන්ගෙන් නොව, අත්දැකීම් සහ පාරම්පරිකව ඔවුන් උකහාගත් දැනුම් පද්ධතියක් තුළින්ය.

වියලන ලද එළවලු සහ පලතුරු වර්තමානය වන විට කෙතරම් ජනප්‍රියද කියතොත් ව්‍යාපාර මට්ටමෙන් පවා එය සිදු කරනු ලබයි. මෙය ශ්‍රී ලංකාවට අරුමයක් නොවන අතර වියළීම මගින් ආහාර කල් තබා ගැනීම අතීතයේදී ජනප්‍රියව පැවතිනි. සමකය ආසන්න රටක් හේතුවෙන් අපට වසර පුරා හොඳින් ලැබෙන හිරු එළිය උපයෝගී කරගෙන පැරැන්නන් එළවලු, පලතුරු,



ආදි පලතුරු සහ ජාඩි ආදිය හොඳින් සකසාගෙන, පිරිසිදු ලෙස ගබඩා කර ආහාර හිඟ කාලසීමාවලදී ප්‍රයෝජනයට ගත්තා මෙන්ම, අහාර රුචිය වර්ධනය කරවන අහාර ලෙසද මේවා යොදා ගෙන ඇත.

වැලි යට තබා ආහාර පරිරක්ෂණය කිරීම පිළිබඳව මනා දැනුමක් ඔවුන් සතු විය. අල වර්ග, දෙහි, කහ, ඉඟුරු, බැදී දෙල්, කොස් දෙල්, වල් දෙල් ආදිය, ඒවා හටගන්නා වාරයන් හිදී වැලිවල යට කිරීමෙන්, අනාගතයට ප්‍රයෝජනයට තබාගත්තෝය. ස්වභාවිකව සොයාගත් ද්‍රව්‍ය භාවිතා කර ගනිමින් ආහාර පරිරක්ෂණයට අතීත ශ්‍රී ලාංකිකයන් දැක්වූ සමත්කම පලතුරු, මස් වැනි දෑ මී පැණි වල ගිල්ලවා කල් තබා ගැනීමේ වැනි ක්‍රමවේද මගින් පැහැදිලි වනු ඇත. මී පැණි පමණක් නොව සාන්ද්‍ර සිනි ද්‍රාවණවල පවා ආහාර ගිල්වා කල් තබා ගන්නා ලදී. උක්ත සඳහන් කළ ආහාරවලට අමතරව, අලුත් අවුරුදු කාල සීමාව තුළ අතිරික්තව නිපදවෙන කැවුම් ආදිය, මෙම  ක්‍රමය යටතේ කල් තබා ගන්නා ලදී. අච්චාරු යෙදීම වැනි ක්‍රමවේද මගින්, ආහාර කල්තබාගැනීම පිළිබඳ දැනුම පමණක් නොව තාක්ෂණික ක්‍රමවේද කිහිපයක් එකට යොදා ගැනීමට ඔවුනට තිබූ හැකියාව පිළිබඳව මනා ලෙස අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

පසු අස්වනු සහ, ආහාර පරිරක්ෂණය කිරීමේදී, ක්‍රමානුකූලව ආහාර ගබඩා කිරීම සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කරයි. තාක්ෂණික වශයෙන් ඉතා ඉහළ වටිනාකමක් සහිත වසර ගණනාවක් වුවද ප්‍රමිතියෙන් යුතුව භාවිතා කළහැකි ගබඩා ක්‍රමවේද ශ්‍රී ලාංකිකයන් සතු විය. සහල් යනු හෙළයන්ගේ ප්‍රධාන ආහාරය විය. අස්වනු නෙළූ පසු අටු කොටු පිරී ඉතිරී යාම සෞභාග්‍යයේ සංකේතය විය. ගබඩා ක්‍රමවේදවලදී අටුව, වී බිස්ස, ධාන්‍ය ගබඩා කිරීමේදී සුවිශේෂී ස්ථානයක් දිනා ගත්තේය. එම ගබඩා ක්‍රමවේද නිර්මාණය කිරීමට යොදාගත්, විද්‍යාත්මක ක්‍රමවේද නිසා දීර්ඝ කාලයක් ධාන්‍ය වර්ග කිසිදු උවදුරකට ලක් නොවී ගබඩා කර තබා ගැනීමට හැකි විය. එපමණක් නොව වරුව, කුරුණිය, පැස, වෙනිය වැනි ක්‍රමේද හරහා මනා ලෙස ධාන්‍ය කල් තබා ගත හැකි විය. මෙහිදී, ගබඩා ඒකකවල ධාන්‍ය ගබඩා කිරීමට මත්තෙන් ඒවා ඉතා හොඳින් සුද්ද පවිත්‍ර කර, ප්‍රතිසංස්කරණය කර, විශේෂයෙන් කඩතොළු ආදිය ඉවත් කිරීමට කටයුතු කිරීමෙන් අනතුරුව, තෙතමනය ඉවත්වනතෙක් හොඳින් වියලා ගත් ධාන්‍ය ඒවා තුළ ගබඩා කිරීම සිදු කර ඇත. එපමණක් නොව මෙම ගබඩාවන් නිර්මාණය කිරීමේදී, කෘමි



උවදුරුවලින් ධාන්‍ය ආරක්ෂා කිරීම, ධාන්‍යවල පැවතිය යුතු ජල ප්‍රමාණය, සහ හොඳ වාතාශ්‍රයක් සපයා දීමවැනි කරුණු සලකා බලා, ගබඩා ඒකක සෑදීම සඳහා අමුද්‍රව්‍ය තෝරා ගැනීම සිදු කිරීමත් විශේෂත්වයකි. ධාන්‍ය ගබඩා  කර ඇති අවස්ථාවලදී පවා, නිරන්තරයෙන් එම ගබඩා නිරීක්ෂණය කරමින්, පිරිසිදු කරමින්, ධාන්‍ය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළහ.

කල් තබා ගන්නා ආහාර බොහොමයක් පිරිසිදු මැටි බඳුන්වල හොඳින් ආවරණය කර ගබඩා කරන ලදී. රසායනික ප්‍රතික්‍රියා සිදු නොවීම මගින්, ආහාර විස වීම් වලින් තොරව නැවත භාවිතයට ගැනීමට හැකිවිය. අතිරික්ත නිෂ්පාදන කාලය තුළ ගබඩා කර සංරක්ෂණය කර ගැනීමට යොදාගත් තවත් විධිමත් ක්‍රමවේදයක් ලෙස දුම්මැස්ස හඳුනා ගත හැකිය. එමගින් දීර්ඝකාලීනව පමණක් නොව එදිනෙදා ආහාර සංරක්ෂණය කිරීමෙහිලා ප්‍රමාණවත් කාර්යය භාරයක් ඉටු කළේය. ලිපෙහි නිපදවන දුමාරයේ අඩංගු සංයෝගය මගින් ක්ෂුද්‍රජීවී ක්‍රියා පාලනය කර ආහාර නරක් වීමෙන් වළක්වා ගනී. කල් තබා ගැනීමට අවශ්‍ය අල, මස් මාළු, මිරිස් සහ එළවලු ආදිය, දුම්මැස්සේ තබා භාවිත කිරීමට පැරැන්නෝ හුරු වී සිටියෝය. කොලපත්, පුවක් පත්, හන, පොල් කොළ සහ පන් වලින් සකසන ලද ඇසුරුම්අහාර අසුරා තබා ගැනීම සඳහා යොදා ගත් අතර ඒවා හොඳින් වාතාශ්‍රය ලැබෙන ලෙස සකස් කළ ඇසුරුම් විය.

ආහාර පිළියෙළ කිරීමේදී, ඉතා පිරිසිදුවට, සැලකිල්ලෙන් ආහාර පිළියෙල කිරීමට පැරැන්නන් උනන්දු වූහ. එමගින් පිසින ලද ආහාරවල ගුණාත්මක බව තහවුරු වීම නිසා, නරක් නොවී භාවිතයට ගන්නා තෙක් හොඳ තත්වයේ ආහාර පවත්වා ගැනීමට හැකි විය. ආහාර කෙරෙහි පැවති ගෞරවය මෙකල කැපී පෙනෙන සාධකයක් විය. මේ හේතුව නිසා ආහාර පිසිමේදීත්, ගබඩා කිරීමේදීත්, වඩාත් උවමනාකමකින් එම කාර්යන්හි නිරත විය. එහෙයින් අවශ්‍ය ආහාර ප්‍රමාණය පමණක් ප්‍රයෝජනයට ගන්නා ලදී. තවද ලාංකිකයන්, සත්කාර කිරීම අතින් ඉදිරියෙන්ම සිටින රටක් බව රොබට් නොක්ස් වැන්නවුන් පවා තම සටහන්වල දක්වා ඇත. අතීත  ශ්‍රී ලාංකිකයන් පිසිනලද හෝ නොපිසින ලද ආහාර, තම අසල වැසියන්, නෑදෑ හිතමිතුරන් පමණක් නොව දිළින්දන් සමග පවා බෙදා ගැනීමට උත්සුක විය. මෙමගින් පෝෂණ අගය වර්ධනය විය. මෙම සංකල්පය තුළ පවතින සුන්දරත්වය නම්, ආහාර හරහා හුවමාරුවුනු, අපේකමයි. අනෙකාගේ පෝෂණය සහ කුසගින්න පිළිබඳව පැවති සානුකම්පිත බව සහ වගකීම් සහගත බවයි. තවද අතීත ශ්‍රී ලාංකිකයන් ආහාර පිළියෙළ කිරීමේදී, රසවත් ව, ගුණවත්ව ඒවා පිළියෙල කළා පමණක් නොව ආහාරය භුක්ති

විඳින පුද්ගලයාගේ රුචි අරුචි කම්, සෞඛ්‍ය තත්වය පිලිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා තිබේ. එමගින් පිළියෙළ කරන ලද ආහාර අපතේ යාම වළක්වා ගැනීමට හැකි වන බව පැහැදිලිය. මේ සියලුම ක්‍රම වේදයන් හරහා අහාර සුරක්ෂිතතාවය මෙන්ම, පෝෂණ අගය ඉහළ නැංවීම සිදු විය. එපමණක් නොව විවිධ රසයන් එක් වීම නිසා, ආහාර රුචිය වර්ධනය කිරීමටද එය බලපාන්නට ඇත. පහසුවෙන් අඩු වියදමින් නිෂ්පාදනය කරගත හැකි නිසා තාක්ෂණය දැනගත් ඕනෑම කෙනෙකුට නිෂ්පාදනය කරගෙන, ආහාර හිඟ කාලයේදී භාවිතයට ගැනීමට හැකි වීමද විශේෂත්වයකි.



අද වන විට ලෝකය තාක්ෂණික වශයෙන් දියුණු තත්වයකට පත් වී ඇත. ශ්‍රී ලංකාව තුළත්, කෘෂිකාර්මික පිලිවෙත් කාලයත් සමග දියුණු තත්වයට පත් වී ඇත. කෙතරම් දියුණු ලෝකයක වුවද, යහපත් ලක්ෂණය වියැකී යයි නම්, එය තිරසර නොවනු ඇත. දැනට වෙළඳපොලේ පවතින බොහොමයක් ආහාර නිෂ්පාදන වැඩිදියුණු කර ඇත්තේ පසු අස්වනු කළමනාකරණය පිළිබඳ දේශීය තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම මගින්ය. නමුත් තවමත් සම්ප්‍රදායික පසු අස්වනු තාක්ෂණය සහ ආහාර පරිරක්ෂණ ක්‍රමවේද උපයෝගී කරගෙන වාණිජමය වශයෙන් සහ ගෘහස්තව වැඩිදියුණු කරන ලද ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව අප සතුව පවතී. ගෘහස්ථ මට්ටමට පැමිණෙන විට නිවාස තුළ ආහාර නාස්තිය අවම කිරීමේ වගකීම සෑම පුද්ගලයෙක්ම සතු වේ. සෑම විටම අතිරික්තය හඳුනාගෙන ඒවා ගෘහස්ත මට්ටමෙන් නිවැරදි තාක්ෂණික ක්‍රමවේද යොදාගෙන පරිරක්ෂණය කිරීමත්, නිසි කාලයේදී පරිභෝජනය කිරීමත් වැදගත්වේ. එපමණක් නොව ඒවා ගබඩා කිරීමේදී පිරිසිදුව නිවැරදි ක්‍රමවේද අනුගමනය කරමින් එය සිදු කළ යුතුය. වෙළඳපොල තුළ වුවත් ආහාර මිලදී ගැනීමේදී අවශ්‍යතාවය සහ නිවැසියන්ගේ සහ සංග්‍රය භුක්ති විඳින්නාගේ සිතැඟිවලට අනුව ආහාර මිලදී ගැනීමත් ඉතා වැදගත්ය. අන් අය සමග අතිරික්තය බෙදා ගන්නා විට ගුණාත්මක භාවයෙන් ඉහළම දේ බෙදා හදා ගත යුතුය. නොඑසේනම් සිදුවන්නේ, තවදුරටත් නාස්තියකි. ආහාර පිළියෙළ කිරීමේදී පවා රස ගුණ දෙකම ආරක්ෂා වන පරිදි, නිසි ප්‍රමාණවලින් පිළියෙල කර ගැනීම මගින්ද, අහාර නාස්ති වීම වළක්වා ගත හැකි වනු ඇත. වර්තමානයේ ආහාර ගබඩා කිරීම පිළිබඳව කරුණු විමසා බලන විට, මහා පරිමාණ ගබඩාවල නිසි කළමනාකරණයක් නොමැති ප්‍රමිතියෙන් තොර ගබඩා පහසුකම් හේතුවෙන්ද, ගෘහස්ථ මට්ටමේදී ආහාර ගබඩා කිරීමේදී දක්වන නොසැලකිලිමත් බව සහ ඒ පිළිබඳව නොදැනුවත්කම හේතුවෙන්ද ආහාර අපතේ යාම සිදු වේ. අපිරිසිදු භාජනවල ගබඩා කිරීම, කලින් ගබඩා කළ භාජන පිරිසිදු නොකර භාවිතය, පලුදු වූ භාජන යොදා ගැනීම වැනි හේතූන් මත ආහාර ද්‍රව්‍යවල ගුණාත්මක බව ඉතා ඉක්මනින් අඩු වීම සිදුවේ. නමුත් පැරැන්නන් වඩාත් විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේම විධිමත් ලෙස ගබඩා කිරීම් සිදු කර ඇති බව පැහැදිලිය.

අතිශය කාර්ය බහුල වූ ලෝකයක එදා මෙන් කාලය යොදවා සාම්ප්‍රදායික ආහාර පරිරක්ෂණ පිළිවෙත් වෙත පමණක්ම සම්පූර්ණයෙන් යොමුවීම ද ප්‍රායෝගිකව සිදු කළ නොහැක. නමුත් ආහාර නාස්තිය යන ගැටලුවට පිළිතුරු සෙවීමට නම්, කෘෂිකාර්මික අගය දාමයන් තුළ නිසි තාක්ෂණික පිළිවෙත් උපයෝගී කරගනිමින් හැකිතාක් දුරට නවීන තාක්ෂණය සමග සාම්ප්‍රදායික පසු අස්වනු සහ ගබඩා කිරීම සම්බන්ධ පාරම්පරික දැනුම ඒකාබද්ධ කර අලුතින් යමක් සිදු කිරීමට අපට හැකියාව පවතී. මෙහිදී අලුතින් සිතන අලුතින් දකින, නව අදහස් සහිත පරපුරට, ඒවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් තරම් සහයෝගයක් ලබා දීම කාලෝචිතය. එපමනක් නොව තනි තනි පුද්ගලයන් ලෙස ගත් කළ ආහාර නාස්තිය අවම කිරීමට, තම තමගේ පෞද්ගලික වගකීම හඳුනාගෙන කටයුතු කිරීම ඉතාමත් වැදගත් කාරණාවකි. අපගේ වටිනාකම් අමතක නොකර අතීතයෙන් උකහා ගත හැකි සාරවත් දෑ තුළින් ඉදිරියට පියවර තැබීමට අප දැන්වත් පසුබට නොවිය යුතුබව අවධාරණය කරනු කැමැත්තෙමි.



**මහාචාර්ය සංජීවනී ගිනිගද්දර**
කෘෂි පද්ධති පිළිබඳ මහාචාර්ය
කෘෂිකර්ම පීඨය
රජරට විශ්ව විද්‍යාලය

# ලැබූ දැනුම විමසමු

**39 වෙළුම - 3 කලාපය 2022 ජූලි - සැප්තැම්බර්**

***විදුරාව සඟරාවේ මෙම කලාපය කියවීමෙන් ඔබ ලද දැනුම විමසා බලමු.***

මෙම කලාපයෙහි පළව ඇති ලිපි කියවා පහත දැක්වෙන ප්‍රශ්නවලට ඔබට පිළිතුරු දිය හැකිදැයි බලන්න.

*1. හරිද? වැරදිද?*

*(අ) සම්ප්‍රදායික දැනුම යනු නූතන විද්‍යාත්මක දැනුම නොසලකා පැරණි මත අනුවම යම් යම් දේ සිදුකිරීමය.*

*(ආ) වියළි කලාපයේ ඉපැරණි ජල ශිෂ්ටාචාරය ක්‍රිස්තුවර්ෂ 12 වන සියවසින් පසු ආරම්භ විය.*

*(ඇ) කඳුකර ප්‍රදේශයේ ජනතාව තෙත් සහ පැවති රළු භූමි ප්‍රදේශ වලට ගැලපෙන පරිදි තම ජීවිත වෙනස් කර ගෙන ඇත.*

*(ඈ) සම්ප්‍රදායික කෘෂිකර්මයට දේශීය දැනුම , ආගමික හා අධ්‍යාත්මික සම්භවය විශ්වීය බලපෑම හා ස්වභාවික සංසිද්ධි වල සම්මිශ්‍රණයක් පවතියි.*

*(ඉ) ගස්ගොම්මන ලෙස හැඳින්වෙනුයේ වැව් පිටියට ඉහළින් පිහිටි ඉහත්තා බිම් තීරුවයි.*

*2. හරිද? වැරදිද?*

*(අ) සාමාන්‍යයෙන් සම්ප්‍රදායික දැනුම යනු මුඛ මාර්ගයෙන් පැතිරෙන පරම්පරාවෙන් පරම්පරාවට යොමුවන දැනුමයි.*

*(ආ) වැස්ස, සුළඟ, ආර්ද්‍රතාවය යනාදිය පිළිබඳ කාලගුණ පුරෝකථන පළකිරීමට ගොවීහු සම්ප්‍රදායික දැනුම යොදා ගනිති.*

*(ඇ) සත්ව චර්යා ආශ්‍රිතව කාලගුණ පුරෝකථන දැක්වීමේදී වැඩිපුරම යොදාගන්නේ කුරුල්ලන්ගේ හැසිරීම් සහ කෘමීන්ගේ මතුවීම මතය.*

*(ඈ) "අක්වැස්ස" ලෙස හැඳින්වෙන්නේ ඔක්තෝම්බර් 10-15 අතරදී වැටෙන වැස්සටය.*

*(ඉ) සම්ප්‍රදායික කාලගුණ දැනුම සහ විද්‍යාත්මක කාලගුණ දැනුම අතර එකගතාවයක් ඇතිකර ගැනීම කළ නොහැක්කකි.*

*3. හරිද? වැරදිද?*

*(අ) වගාවක පළිබෝධකයන් ලෙසට කෘමිසතුන් පැමිණවීම විවිධ කෙම් ක්‍රම මගින් පාලනය කිරීමට උත්සහ කෙරේ.*

*(ආ) දිවි කරණය යොදා ගැනීම හානිකර සතුන් විකර්ෂණය කරන ක්‍රමයකි.*

*(ඇ) විවිධ ඖෂධ පැළෑටි වල තිබෙන රසායනික සංයෝග කෘමි මර්ධනයට ඉතා අගනේය.*

*(ඈ) පළිබෝධකයන් වගාවක සැරිසැරීම සිදුවන්නේ යම් කිසි කාලවකවානුවකදී නොව සෑම අවස්ථාවකදීය.*

*(ඉ) උඳළු තැටිලි යෙදවීම නිසා ඇතිවන ප්‍රතිරාවය ගොයම් මැස්සන්ගේ බෝ වීම වළක්වයි.*

*4. හරිද? වැරදිද?*

*(අ) පැටිපස්පරානේ යනු, ගවයා, බල්ලා, බළලා සහ කුකුළා යන ප්‍රාණ පහය.*

*(ආ) "බුටැවේ මහ ඇත්තා" යනු පැරණි ගොවීන් අලියාට දී තිබූ නාමයයි.*

*(ඇ) දේශීය ගව වෙදකමේ හිරු, සඳු ඇතුළු ග්‍රහතාරකාවන්ගේ ගමන්මාර්ගය අනුව ඇතිවන පරිසර වෙනස්කම් සැලකිල්ලට නොගනී.*

*(ඈ) දේශීය සත්ව ප්‍රතිකාරවල විශේෂ ලක්ෂණයක් වන්නේ අහිතකර ප්‍රතිඵල අවම වීමය.*

*(ඉ) දිව්‍ය වෘතිකාව යනු ගව ආමාශගත රෝග සඳහා සකසා ගත් ඖෂධයකි.*

*5. හරිද? වැරදිද?*

*(අ) ලෝක ජනගහණයට සරිලනතරම් ආහාර ප්‍රමාණයක් නිපදවා තිබුණද ලෝක ජනතාවගෙන් මිලියන 811 ක් පමණ කුසගින්න සමග අතිශය දරුණු වූ අරගලයක නිරතව සිටිති.*

*(ආ) පසු අස්වනු සංරක්ෂණය යනු අස්වැන්න නෙළීමෙන් පසු එහි ආරක්ෂාව සහතික කිරීම සඳහා සංරක්ෂණය, සැකසීම, ඇසුරුම, බෙදාහැරීම, අලෙවිකරණය සහ භාවිතය පිළිබඳව ගනු ලබන පියවරය.*

*(ඇ) ලුණු දැමීම මගින් සිදුකරනුයේ ආසෘතිය මගින් ආහාරයේ තෙතමනය ඉවත්කර ක්ෂුද්‍රජීවීන් ක්‍රියාකාරීත්වය අවම කිරීමට ලුණු යොදා ගැනීමය.*

*(ඈ) කොස්ඇට, අල, කොස්, දෙහි, කහ, ඉඟුරු යනාදිය වැලියට දැමීමෙන් පරිරක්ෂණය කළ නොහැකිය.*

*(ඉ) පිසූ ආහාර කල් තබා ගැනීමට පිරිසිදු මැටි බඳුන්වල දමා හොඳින් ආවරණය කර තැබීම සාර්ථක පියවරකි.*

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | (අ) වැරදියි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) හරි | (ඉ) හරි |
| 2. | (අ) හරි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) වැරදියි | (ඉ) හරි |
| 3. | (අ) හරි | (ආ) හරි | (ඇ) වැරදියි | (ඈ) හරි | (ඉ) හරි |
| 4. | (අ) හරි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) වැරදියි | (ඉ) හරි |
| 5. | (අ) හරි | (ආ) හරි | (ඇ) හරි | (ඈ) හරි | (ඉ) වැරදියි |

පිළිතුරු









ජාතික විද්‍යා පදනම
47/5 මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07